සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

45 | S | I

# බෞද්ධ ශිෂ්ටාචාරය - I

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා එය සලකුණු කරන්න.

---

01. භාරතීය සමාජ ආධිපත්‍යය සියතට ගැනීමේ අපේක්ෂාවෙන් සිටි ආර්ය සභ්‍යත්වයක් ඇති බමුණන් ඒ සඳහා අනුගමනය කළ විධිමත් ක්‍රියා පිළිවෙත වූයේ,
   (1) වර්ණ ධර්ම සංකල්පය සමාජගත කිරීම යි.
   (2) ස්ව ධර්ම සංකල්පය සමාජගත කිරීම යි.
   (3) ආශ්‍රම ධර්ම සංකල්පය සමාජගත කිරීම යි.
   (4) ආපද් ධර්ම සංකල්පය සමාජගත කිරීම යි.
   (5) උපනයන සංකල්පය සමාජගත කිරීම යි.

02. හිස්තැනට සුදුසු වචනය තෝරන්න.
   බ්‍රාහ්මණ සමාජයේ පැවැති කුල භේදය විවේචනය කරමින් සත්ත්ව ලෝකයේ විවිධත්වයත් මානව වර්ගයාගේ ඒකත්වයත් අතර වෙනස .......................... සූත්‍රය ඇසුරෙන් පෙන්වා දී ඇත.
   (1) අග්ගඤ්ඤ (2) අස්සලායන (3) වාසෙට්ඨ (4) වසල (5) අම්බට්ඨ

03. බ්‍රාහ්මණ සමාජය තුළ කාන්තාවගේ උපත පිළිබඳව පැවැති පොදු පිළිගැනීම කෙබඳු ස්වරූපයකින් යුක්තවී ද?
   (1) ගැහැනු දරුවකුගේ උපත පෙර කර්මයට අනුරූපීව සිදුවන්නක් ලෙස සැලකීම.
   (2) ගැහැනු දරුවකුගේ උපත දෙවියන්ගේ ගර්හාවට ලක්වන්නක් ලෙස සැලකීම.
   (3) ගැහැනු දරුවකුගේ උපත පවුලේ ආර්ථිකයට මහත් බාධාවක් ලෙස සැලකීම.
   (4) ගැහැනු දරුවකුගේ උපත පරලොව සුගතියට බාධාවක් ලෙස සැලකීම.
   (5) ගැහැනු දරුවකුගේ උපත මහත් අභාග්‍යයක් ලෙස සැලකීම.

04. පහත දැක්වෙනුයේ ෂට් ශාස්තෘවරුන් කිහිප දෙනෙකුගේ මූලික ඉගැන්වීම්වල දැක්වෙන කරුණු කිහිපයකි.
   A දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන්, සත්‍ය වචනයෙන් සිදුවන පිනක් නැත.
   B ස්වභාව නියතියකට අනුව සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදුවේ
   C මරණින් පසු සත්ත්වයාගේ සතර මහා භූත විශ්වයේ සතර මහා භූතවලට එකතුවේ
   D කිසිවකු විසින් නිර්මාණය කරන ලද සප්ත පදාර්ථයකින් පුද්ගලයාගේ භව ගමන තීරණයවේ.
   E පෙර කළ කර්ම ගෙවා දැමීමෙන් හා නව කර්ම නොකිරීමෙන් දුකින් නිදහස් විය හැකිය.

   මෙම ඉගැන්වීම් අතරින් නොගැළපෙන ප්‍රකාශය හෝ ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
   (1) A (2) C (3) D (4) B, E (5) A, C

05. සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ ඉගැන්වීම් තුළින් ප්‍රශ්නයකට නිශ්චිත පිළිතුරක් එක් එල්ලේම ලබාගත නොහැක. බ්‍රහ්මජාල සූත්‍රයට අනුව ඒ සඳහා ඔහු පංච නිශේධන ක්‍රමයක් භාවිතයට ගෙන ඇත. එම පංච නිශේධන ක්‍රමයෙහි සඳහන් "නෝ තිපි මේ නෝ "යන්නෙහි අදහස වන්නේ,
   (1) මෙය මෙසේ නොවන්නේ නැතැයි ද මට අදහසක් නොවේ.
   (2) අන් සැටියකින් වේතැයි ද අදහස් නොවේ.
   (3) මේ කාරණය වේතැයි ද අදහස් නොවේ.
   (4) මෙසේ වේතැයි ද අදහසක් නොවේ.
   (5) මෙසේ යැයි ද අදහස් නොවේ.





CamScanner

06. මල්ල රජදරුවන්ගේ අඹ වනයේ බුදුරජාණන් වහන්සේ වැඩසිටින අතර එහිදී .................................. පැවිද්ද සිදුවිය.

(1) ශාක්‍ය කුමාරවරුන්ගේ
(2) භද්දවග්ගිය කුමාරවරුන්ගේ
(3) මහා කච්චායන තෙරුන්ගේ
(4) ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කුමාරිකාවන්ගේ
(5) යසකුල පුත්‍රයා ඇතුලු යහළුවන්ගේ

07. ශාසන ඉතිහාසය හා බැඳුණු වැදගත් සිදුවීම් ගණනාවක් පහත දැක්වේ.

A බුදුරදුන් ඉසිපතනාරාමයේ දී ප්‍රථම ධර්ම දේශනය පවත්වන ලදී.
B ගග්ගරා පොකුණ අසලදී බුදුරදුන් සෝණදණ්ඩ සූත්‍රය දේශනා කරන ලදී.
C බුදුරදුන් වස්කාල දහනවයක් ජේතවනාරාමයේ වාසය කර ඇත.
D ධර්මධර විනයධර භික්ෂු ගැටුම නව වන වස්කාලයේ දී සිදුවිය.
E ගිජ්ජකූට පර්වතයේ දී බුදුරදුන් අටානාටිය සූත්‍රය දේශනා කරන ලදී.

අංග, මගධ, කාසී, කෝසල වත්ස යන ජනපද අතරින් මෙම සිදුවීම් සිදු වූ අනුපිළිවෙළ නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) A, B, E, C, D ය.
(2) B, E, A, C, D ය.
(3) A, C, B, D, E ය.
(4) B, C, E, A, D ය.
(5) C, A, D, B, E ය.

08. බුදු දහමෙහි තුලා කූට මාන කූට වැනි වෙළඳාමේ දී භාවිත වූ වංචනික ක්‍රියා ප්‍රතික්ෂේප කිරීමෙන් අපේක්ෂා කළ සමාජ ආර්ථික සාධාරණත්වය කුමක්ද?

(1) ව්‍යාපාරික කටයුතු සඳහා ජනතාව වැඩි වශයෙන් යොමු කිරීමට පෙළඹවීම යි.
(2) කිරුම් මිනුම් භාවිතය වැඩි වශයෙන් ජන සමාජය තුළ ප්‍රචලිත කිරීම යි.
(3) භාණ්ඩ හුවමාරුව වෙනුවට ක්‍රමයෙන් කාසි භාවිතය සමාජය තුළ ප්‍රචලිත කිරීම යි.
(4) පාරිභෝගිකයා සුරක්ෂිත කිරීම සහ විශ්වාසවන්ත සදාචාරාත්මක වෙළඳ පද්ධතියක් ගොඩ නැගීම යි.
(5) ව්‍යාපාරික කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම වැඩි වශයෙන් ව්‍යාප්ත කිරීම යි.

09 තුන් ලොව තතු ලෙසට - දැනගෙන නො දත් මෙලොවට
දෙසුයෙන් නියම කොට - ........................
යනාදී වශයෙන් දැක්වෙන මෙම පද්‍යයෙන් විස්තරවන බුදුගුණය කුමක් ද?

(1) භගවා ගුණය
(2) බුද්ධ ගුණය
(3) සුගත ගුණය
(4) විජ්ජාචරණ ගුණය
(5) ලෝකවිදූ ගුණය

10. බුදුරජාණන් වහන්සේ නායකයෙකු ලෙස තමන් වදාළ ධර්මය ප්‍රායෝගික ව අනුගමනය කළ බව තහවුරු වන සුවිශේෂී නායකත්ව ලක්ෂණය කුමක් ද?

(1) උපාය කෞශල්‍යයෙන් යුක්තවීම.
(2) යථාවාදී තථාකාරී ගුණයෙන් යුක්තවීම.
(3) මහා කරුණා ගුණයෙන් යුක්තවීම.
(4) මහා ප්‍රඥාවෙන් යුක්තවීම.
(5) ශ්‍රාවකයන්ගේ සුවපහසුව ගැන සොයා බැලීම.

11. බුදුරජාණන් වහන්සේ වරක් චම්පා නුවරට වැඩම කළපසු එගම නායක බමුණෙක් උන්වහන්සේ දැකීමට යාමට සූදානම් විය. ඔහුගේ සහචරයෝ ඒ ගමන වැළැක්වීමට විවිධ කතා කීහ. එහිදී බුදුරදුන්ගේ ගුණ කදම්බය වර්ණනා කළ නායක බමුණා සෙසු බමුණු පිරිස ද කැටිව බුදුරදුන් වෙත පැමිණියේ ය. එම බමුණා වූයේ,

(1) අග්ගිකභාරද්වාජ ය.
(2) වාසෙට්ඨ ය.
(3) සුන්දරිකභාරද්වාජ ය.
(4) ජානුස්සෝනි ය.
(5) සෝණදණ්ඩ ය.

12. පළමු ධර්ම සංගායනාවේ දී සංගීති කාරක තෙරුන් වහන්සේලාගෙන් ආනන්ද තෙරුන් වහන්සේට චෝදනා පහක් එල්ල විය. පහත සඳහන් කරුණු අතරින් එම චෝදනාවන්ට අයත් නොවන කරුණ කුමක් ද?

(1) බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය පළමුව කාන්තාවන් ලවා වැන්දවීම.
(2) බුදුන් වහන්සේට කල්පයක් ජීවත් වන ලෙස ආරාධනා නො කිරීම.
(3) බුදුන් වහන්සේගේ වැසි සළුව පයින් පාගා ගෙන මැසීම.
(4) සම්බුද්ධ ශාසනයේ පැවිදි වීම සඳහා කාන්තාවන් උත්සාහවත් නොකිරීම.
(5) බුද්ධානු බුද්ධක ශික්ෂාපද කවරේදැයි බුදුරදුන්ගෙන් අසා නො ගැනීම.





CamScanner

13. සාර්ථක විවාහ ජීවිතයක් පවත්වාගෙන යාමට හැකිවන්නේ ...................... යන ගුණ ධර්ම යුවතිපති දෙදෙනා තුළම සමානව පැවතුණ හොත් පමණක් බව බුදුරජාණන් වහන්සේ නකුල මාතා හා පිතා සම්බන්ධකරගෙන සමජීවි සූත්‍රය තුළින් අවධාරනය කර ඇත.

(1) සද්ධා, සීල, චාග, පඤ්ඤා (2) සද්ධා, සීල, සුත, පඤ්ඤා (3) සද්ධා, සීල, හිරි, ඔත්තප්ප
(4) සද්ධා, සීල, විරිය, බල (5) සද්ධා, සීල, වීරිය, පඤ්ඤා

14. සියලු කාර්යයන්හි සාර්ථකත්වය ලැබීමට අවශ්‍ය ශක්තීන් මිනිසා තුළ උපතින්ම පිහිටා ඇතිබව බුදු සමය පෙන්වා දෙයි. ඒ බව පෙන්වා දෙන සූත්‍රයක් ලෙස අත්තකාර සූත්‍රය සැලකේ. එහි සඳහන් ඨිතිධාතු යන්නෙන් අදහස් කෙරෙනුයේ,

(1) විරිය පවත්වාගෙන යාම (2) වීරිය බලවත්වීම (3) ස්ථාවර වීරියකට පැමිණීම
(4) ක්‍රියාවක් ආරම්භ කිරීම (5) ක්‍රියාවක් සාර්ථක කර ගැනීමට උපක්‍රම යෙදීම

15. පහත සඳහන් සූත්‍රාගත පාඨවලින් පුද්ගල ස්වාමිත්වයට හා ස්වාධීනත්වයට සෘජු සම්බන්ධතාවක් පෙන්නුම් නොකරන පාඨය ඇතුළත් වරණය වනුයේ,

(1) "සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤො අඤ්ඤො විසෝධයේ"
(2) "අත්තා හි අත්තනෝ නාථෝ කෝ හි නාථෝ පරෝ සියා"
(3) "තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරෝ තථාගතා"
(4) "අප්පමාදේන මඝවා - දේවානං සෙට්ඨතං ගතො"
(5) "අත්තදීපා විහරථ භික්ඛවේ අත්ත සරණා අනඤ්ඤ සරණා"

16. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සමාජ සම්භවය පිළිබඳව කෙරෙන විවරණයන්ට අදාල ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A ආභස්සර බඹලොවින් චුත ව ආ පිරිසක් මිනිස් ලොව ඕපපාතික ව උත්පත්තිය ලබති.
B කෙත්වතුවලට අධිපති වූ බැවින් රජු "ඛත්තිය" නම් වේ.
C සමාජ පරිණාමයේ දී මානව අවශ්‍යතා මූලික කොට ගෙන එම පරිණාම ක්‍රියාවලිය සිදුව ඇත.
D සමාජ ප්‍රභවය, පරිණාමය හා විකාශය පාරභෞතික බලවේග හේතුවෙන් සිදු වූවකි.
E සමාජ ආරම්භයේ දී මෙලොව ඇති වූ පළමු අසද් ධර්මය තෘෂ්ණාවයි.

අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් සමාජ ප්‍රභවය පිළිබඳ විස්තරයට අනුව ඉහත ප්‍රකාශවලින් නිවැරදි වන්නේ,

(1) A පමණි (2) A සහ B පමණි (3) A, B සහ C පමණි
(4) A, B, C සහ E පමණි (5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

17. පහත දැක්වෙන ප්‍රකාශවලින් බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම හා නවීන ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයන් අතර පවත්නා වූ සැබෑ සමානාත්මතා ලක්ෂණ අතුරින් වඩාත් නිවැරදි වන්නේ මින් කුමක් ද?

(1) මෙම පාලන ප්‍රතිපත්ති දෙකට ම පදනම් වී ඇත්තේ පාලකයා සතු අසීමිත බලයයි.
(2) මෙම පාලන ප්‍රතිපත්ති දෙකට ම පදනම් වී ඇත්තේ ජනතා පරමාධිපත්‍ය හා සදාචාරාත්මක වගකීමයි.
(3) මෙම පාලන ප්‍රතිපත්ති දෙකට ම පදනම් වී ඇත්තේ රටක පවත්නා වූ ආගමික නීතිරීතීන් ය.
(4) මෙම පාලන ප්‍රතිපත්ති දෙකට ම පදනම් වී ඇත්තේ පුද්ගල අභිමතය පරිදි රාජ්‍යය මෙහෙයවීමට අවකාශය සලසා දීමයි.
(5) මෙම පාලන ප්‍රතිපත්ති දෙකට ම පදනම් වී ඇත්තේ බහුතර කැමැත්තට අනුකූලව කටයුතු මෙහෙයවීමට අවකාශය සලසාදීම යි.

18. ජන සම්මතවාදී පාලනයක සාම්ප්‍රදායික මූලධර්ම රැකගනිමින් පාලන කටයුතු සිදුකිරීමෙන් එකී පාලන තන්ත්‍රය පහසුවෙන් බිඳ නොවැටෙන්නේය. යනු බුදුසමයේ පිළිගැනීමයි. එවැනි සාරධර්ම පද්ධතියක් ලෙස ................................................ දැක්විය හැකි ය.

(1) සතර සංග්‍රහ වස්තු (2) පංච සීල ප්‍රතිපදාව (3) දසරාජ ධර්ම
(4) දස සක්විතිවත් (5) සප්ත අපරිහානීය ධර්ම

19. සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා යන ගාථා පාඨයට අනුව බුදු දහමෙහි පින්වල ප්‍රායෝගික වටිනාකම පිළිබඳ ව වඩාත් නිවැරදි ප්‍රකාශනය කුමක් ද ?

(1) පින් කිරීම පමණක් සංසාරයෙන් එතෙරවීමට ප්‍රමාණවත්වේ.
(2) පින්කිරීම සසර ගමන සුවපත් කිරීමට සහ සුගතිගාමී වීමට උපකාරීවේ.
(3) පින්කිරීම යනු නිර්වාණය අවබෝධ කර ගැනීම සඳහා වන අවසාන පියවර යි.
(4) නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට පින් කිරීම බාධාවකි.
(5) පින්කිරීම හා කුසල් කිරීම එකිනෙකට සම්බන්ධයක් නොමැති ක්‍රියාවන් දෙකකි.





CamScanner

20. අත්තාධිපතෙය්‍ය ක්‍රමය මගින් හොඳ නරක විනිශ්චය කිරීමේ දී පුද්ගලයෙකු ඒ පිළිබඳ ව විමසා බැලිය යුත්තේ කෙසේ ද?
   (1) තමා කිසියම් ක්‍රියාවක් කරන විට ලෝකයා මට මේ ගැන කුමක් පවසනු ඇත් ද යනුවෙන් විමසා බැලීම.
   (2) තමා කිසියම් ක්‍රියාවක් කරන විට ධර්මයට අනුව මෙය නිවැරදි ද යනුවෙන් පමණක් විමසා බැලීම.
   (3) තමාගේ හෘද සාක්ෂියට අනුව මෙවැනි වැරදි ක්‍රියාවක් කිරීම සුදුසු ද යනුවෙන් තමාගෙන් ම විමසා බැලීම.
   (4) අන් අය මට මෙසේ කරනවාට මා කැමැති ද යනුවෙන් විමසා බැලීම.
   (5) පාරම්පරික සිරිත් විරිත්වලට මෙය එකඟ ද යනුවෙන් විමසා බැලීම.

21. ශ්‍රද්ධාව ආකාරවතී හා අමූලිකා වශයෙන් කොටස් දෙකකට බෙදෙන අතර මේ කොටස් දෙකට අනන්‍ය වූ ලක්ෂණ ද දක්නට ලැබේ. ඒ අනුව ආකාරවතී ශ්‍රද්ධාවෙන් යුක්ත පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණයකි.
   (1) ආමිස පූජාවන් කෙරෙහි අසීමිත හැඟීමෙන් ක්‍රියාකිරීම.
   (2) නොපෙනෙන බලවේග කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
   (3) සියල්ල කර්මානුරූපීව සිදුවන බව පිළිගැනීම.
   (4) ආගම කෙරෙහි අසීමිත භක්තියෙන් ක්‍රියා කිරීම.
   (5) තෙරුවන් කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීම.

22 සතර බ්‍රහ්ම විහරණ, ධර්මයෙහි චතු අප්පමඤ්ඤා ලෙස හැඳින්වීමට හේතුව වන්නේ,
   (1) එම ගුණාංග ලෞකික සැප වඩා වර්ධනය කිරීමට හේතුවන බැවිනි.
   (2) ඒවා සීමා රහිත ව සියලු සත්ත්වයන් කෙරෙහි වඩා වර්ධනය කරන බැවිනි.
   (3) ඒවා වර්ධනය කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවිනි.
   (4) එම ගුණාංග රහතන්වහන්සේලාට පමණක් සීමාවන බැවිනි.
   (5) පාලකයින් පමණක් එම ගුණයන්ගෙන් සමන්විත විය යුතු බැවිනි.

23. බුදු රජාණන් වහන්සේ පරිසර සංරක්ෂණයට අදාළ ව කරුණු රැසක් විනය ශික්ෂාවන් හා සේඛියාවලින් ඉදිරිපත්කොට ඇත. ඒවායින් කිහිපයක් පහත සඳහන්වේ. එයට අදාළ නොවන ප්‍රකාශය කුමක් ද?
   (1) ගස්වැල් සිඳීම මෙන් ම පැළවන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්තියකි.
   (2) යටි සුළඟට සෙනසුන් ගසා නොදැමිය යුතුබව චුල්ලවග්ග පාළියෙහි සඳහන්වේ.
   (3) වනාන්තර ගිනි තැබීම භික්ෂූන්ට තහනම් කර ඇත.
   (4) ගිලන් භික්ෂුවක විසින් ජලයට මලමුත්‍ර හෙළීම නොකළ යුතු ය.
   (5) යම් භික්ෂුවක් පොළව කෙටීම හෝ වෙනත් කෙනෙකුලවා එසේ කිරීම පාචිත්‍යය ඇවතකි.

24. ස්වභාව සෞන්දර්ය හා නිර්මාණාත්මක සෞන්දර්ය බුදුරදුන්ගේ මෙන් ම ශ්‍රාවකයින්ගේ ද ඇගයීමට ලක්වූ අවස්ථා ත්‍රිපිටක සාහිත්‍යයේ සුලභ ව දැකිය හැකි ය. එහෙත් "නච්ච ගීත වාදිත විසූක දස්සන" යන ශික්ෂාපදයෙන් සරාගී සෞන්දර්ය රසාස්වාදය තහනම් කොට තිබේ. එය අදාළ වන්නේ,
   (1) සියලු ම බෞද්ධයින්ට ය.
   (2) උපාසක උපාසිකාවන්ට ය.
   (3) පෙහෙවස් සමාදන් වූවන්ට ය.
   (4) කුමාර බ්‍රහ්ම චර්යාවේ හැසිරෙන අයට ය.
   (5) සිව්වනක් පිරිසට ය.

25. පුද්ගලයෙකුගේ ආචාර ධර්ම සකස්විය යුත්තේ ඔහුගේ කායික හා මානසික අසහනයට හේතු නොවන ආකාරයෙන් මෙන් ම සමාජයට කිසියම් මෙහෙයක් වන අයුරිනි. බෞද්ධ ආචාර ධර්ම සියල්ල ම ඉදිරිපත් වී ඇත්තේ ඒ අරමුණිනි. මේ ආචාර ධර්මවලට ගැනෙන අප්පිච්ඡතා ගුණයෙන් අදහස් වන්නේ,
   (1) කාම සම්පත් අතහැර ගත කරන විරාගී චරණය යි.
   (2) අසීමිත අපේක්ෂා හා බලාපොරොත්වලින් තොරව ඒවා අල්ප කරගෙන කටයුතු කිරීම යි.
   (3) පහසුවෙන් පෝෂණය කළ හැකි බව යි.
   (4) සියලු ආශාවන්ගෙන් වියුක්තව කටයුතු කිරීම යි.
   (5) සරල සැහැල්ලු කටයුතු සහිතව ක්‍රියා කිරීම යි.



A ganna BC panthiya දිල්ෂාන් පතිරණ 071-1118591
CamScanner

26. ආර්ථික සමෘද්ධිය ගෘහස්ථ ජීවිතයට අත්‍යවශ්‍ය වූවක් ලෙස පිළිගන්නා බුදුසමය ඒ සඳහා දැහැමි පිළිවෙතක් ද නිර්දේශ කරයි. එසේම උපයාගත් ධනය කල්පනාකාරී ව හා නිවැරදි දැක්මක් සහිත ව පරිභෝජනය කළයුතු බවද දක්වයි. ඒ අනුව පුද්ගලයා ධාර්මිකව උපයාගත් ධනය
   (1) නොමුලාව ආදීනව දැන පරිබෝජනය කළ යුතු ය.
   (2) දානාදී සත්ක්‍රියා සඳහාම කැප කළ යුතු ය.
   (3) රිසිසේ පරිභෝජනය කළ යුතු ය.
   (4) තව තවත් වැඩිදියුණු කරමින් පරිභෝජනයකළ යුතු ය.
   (5) සුරක්ෂිත කොට තැබීමට වැඩිකොටසක් වෙන් කළ යුතු ය.

27. උයන්වතු වැවීම, වන වගාව, ඒදඬු පාලම් තැනීම, පැන් පොකුණු තැනීම හා පානීය ජල පහසුකම් සැපයීම දිවා රෑ පින් වැඩෙන උතුම් පින්කම් ලෙස සංයුත්ත නිකායේ වන රෝපා සූත්‍රයේ දැක්වේ. එසේ ම ගස් වැල් හා බීජ සිඳීම ජලයේ හෝ විවෘත පරිසරයේ හෝ මුත්‍රා කිරීම, කෙළ ගැසීම ආදිය සිදු නොකළ යුතු බව විනය නීති රීති මගින් අවධාරණය කොට ඇත මෙම සමස්ත ඡේදයේ අන්තර්ගතයෙන් ප්‍රකට වන්නේ,
   (1) වන වගාව සසුනේ උසස් ලෙස වර්ණනා කොට ඇති බව යි.
   (2) ජල කළමනාකරණය හා සංරක්ෂණය උසස් පින්කමක් වන බව යි.
   (3) පරිසර සංරක්ෂණය ඉහළින් අගය කොට ඇති බව යි.
   (4) ස්වභාව සෞන්දර්යයෙන්ම අගය කොට ඇති බව යි.
   (5) පරාර්ථයට හේතුවන සමාජ සත්කාර නිර්වාණගාමී මාර්ගය වන බව යි.

28. බුදුරදුන් භෞතික මෙන් ම මානව සම්පත ද නිසිලෙස කළමනාකරණය කොට විධිමත් ලෙස සම්පත්වලින් ප්‍රයෝජන ගෙන ඇත. ඒ අනුව මානව සම්පත විධිමත් ව කළමනාකරණය කළ අවස්ථාවක් වන්නේ,
   (1) බුදුරදුන්ගේ අතුරිත චාරිකාවන්හි දී ඇතැම් විට භික්ෂූන් සමග වැඩම කිරීම.
   (2) විවේකී අවස්ථාවල දී භික්ෂු සංඝයාට ධර්ම දේශනා පැවැත්වීම.
   (3) දවස කාලච්ඡේද පහකට බෙදා වැඩ සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.
   (4) උදෑසන මහා කරුණා සමාපත්තියට සමවැදී පිහිට විය යුතු අය විමසා කටයුතු කිරීම.
   (5) ප්‍රථම රහතුන් වහන්සේලා හැට නම වෙන් වෙන් ව ධර්ම ප්‍රචාරක කටයුතුවල යෙදවීම.

29. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් බෝග විනාශ මුඛ හයට අදාළ ආදීනව තිස් හයක් දැක්වේ. එම තිස් හයෙන් කිහිපයක් පහතින් දැක්වේ.
   A තම අඹු දරුවන්ගේ ආරක්ෂාව නැති වී යාම.
   B කලකෝළාහල බහුල වීම.
   C තම දේපළ වස්තූන්ගේ ආරක්ෂාව නැති වී යාම.
   D බොහෝ දුක් කරදරවලට භාජනය වීම.
   E මිතුරන්ගේ අප්‍රසාදයට භාජනය වීම.
   F සමාජය ඔහුගේ වචනය නො පිළිගැනීම.

   මේවායින් අවේලාවේ වීථි සංචාරයට අදාළ ආදීනවයන් දැක්වෙන වරණය තෝරන්න.
   (1) A, C, D (2) B, D, E (3) C, B, D (4) B, C, F (5) D, E, F

30. සිගාලෝවාද සූත්‍රයේ ඇතුළත් පැවිදි උතුමන්ගෙන් ගිහියනට ඉටුවිය යුතු යුතුකම් අතරින් නොගැළපෙන යුතුකම ඇතුළත් වරණය කුමක් ද?
   (1) පවින් වැළැක්වීම. (2) යහපතෙහි යෙදවීම.
   (3) යහපත් සිතින් අනුකම්පා කිරීම. (4) සුගතියට මග කියා දීම.
   (5) සමානාත්මතාව දැක්වීම.

31. පහත දැක්වෙනුයේ මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණුවලින් කිහිපයකි,
   A සිත මනාසේ පිහිටුවා ගැනීම. B බොහෝ ඇසූ පිරූ තැන් ඇතිබව.
   C කුලයන්හි නො ඇලී කටයුතු කිරීම. D අටලෝ දහමින් කම්පා නො වීම.
   E චතුරාර්ය සත්‍යය දැකීම.

   ඉහත කරුණු ඇසුරෙන් මංගල සූත්‍රයට අයත් මංගල කරුණක් නොවන වරණය තෝරන්න.
   (1) A (2) B (3) C (4) D (5) E



PAST PAPERS WIKI

A ganna BC panthiya දිල්ෂාන් පතිරණ 071-1118591

CamScanner

32. යම් නුවණැත්තෙක් තමා නිසා හෝ අනුන් නිසා හෝ ජීවිත් නොකරයි ද වැරදි පිළිවෙළකින් පුතකු හෝ ධනය හෝ රටක් හෝ නොපතයි ද අධර්මයෙන් තමාගේ වැඩි දියුණුවක් බලාපොරොත්තු නොවෙයි ද ඔහු සිල්වතෙකි, බුද්ධිමතෙකි, ධාර්මිකයෙකි. මෙම අදහස ඇති ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "න පරේසං විලෝමානි - න පරේසං කතාකතං"
(2) "න අත්ත හේතු න පරස්ස හේතු - න පුත්තමිච්ඡේ න ධනං න රට්ඨං"
(3) "යෝ චේ වස්සසතං ජීවේ - කුසීතෝ හීන වීරියෝ "
(4) "අත්තානං චේ පියං ජඤ්ඤා - රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං"
(5) "අත්තනාව කතං පාපං - අත්තජං අත්තසම්භවං"

33. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අනතුරුව ජටිල භික්ෂූන් සමග බිම්බිසාර මහරජතුමන් මුණ" ගැසීමට .................................. පොහෝ දින වැඩම කරනු ලැබුවේ මගධ රාජ්‍යයේ ලට්ඨිවනයට ය.
(1) දුරුතු පුරපසළොස්වක (2) දුරුතු අවඅටවක (3) දුරුතු පුර අටවක
(4) බක්මස පුර අටවක (5) වෙසක් පුරපසළොස්වක

34. "බුදු රජාණන් වහන්සේ විසින් ගැයුවා වූ ධර්මය නොයෙක් ජාතියෙහි මල් එක මලස්නෙක සැලුවා සේ ඒ ඒ සත්ත්වයන් උදෙසා දෙසූ හෙයින් පිළිවෙළක් නැති ව අනාගතයෙහි නො පවත්නා ලෙස තැබුයේ ය. එසේ හෙයින් දන් ම ධර්ම සංගායනාව කරනු කැමතියේ ......" යනුවෙන් සංගායනා සම්බන්ධව මෙම ප්‍රකාශය ඇතුළත් වනුයේ,
(1) පූජාවලියේ ය. (2) චුල්ලවග්ග පාලියේ ය. (3) මහාවග්ග පාලියේ ය.
(4) පාසාදික සූත්‍රයේ ය. (5) සමන්තපාසාදිකාවෙහි ය.

35. සංගායනා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A නිකාය භේදයේ ආරම්භය පළමුවරට වාර්තාවනුයේ දෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුවය.
B විශාලා මහනුවර අශෝකාරාමයේ දී තෙවන සංගායනාව පවත්වන ලදී.
C පළමු සංගායනාවෙන් අනතුරුව බුද්ධ දේශනා ත්‍රිපිටකයක් වශයෙන් සංග්‍රහ විය.
D විනය ශාසනයේ ආයුෂය ලෙස සැලකීමට බඳුන්වනුයේ පළමු සංගායනාවෙන් අනතුරුව ය.
E තෙවන සංගායනාවෙන් අනතුරුව දුසිල් භික්ෂූන් 60,000 ක් සසුනින් නෙරපා දමන ලදී.
ඉහත ප්‍රකාශන අතරින් වඩාත් නිවැරදි වන්නේ,
(1) A, B සහ C පමණි. (2) B, C සහ D පමණි. (3) A, D සහ E පමණි.
(4) A, C, D සහ E පමණි. (5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

36. පහත සඳහන් වනුයේ කණිෂ්ක අධිරාජයා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි
A වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සිව්වන ධර්ම සංගායනාව පවත්වන ලදී.
B පුරුෂ පුරය කණිෂ්ක අධිරාජයාගේ රාජධානිය විය.
C කණිෂ්ක අධිරාජයා වසර හතළිස් අටක් රාජ්‍ය විචාරන ලදී.
D මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කිරීම.
E කණිෂ්ක අධිරාජයා නැළියක පමණ ධාතු තැන්පත්කොට විශාල ස්තූපයක් ගොඩනැංවීම.
ඉහත ප්‍රකාශන අතරින් වඩාත් නිවැරදි වන්නේ,
(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) B සහ D පමණි.
(4) A, C සහ D පමණි. (5) C, D සහ E පමණි.

37. නාලන්දා විශ්ව විද්‍යාලයේ පැවැති අධ්‍යාපන ක්‍රියාවලිය හා පරිපාලන ක්‍රියාවලිය ඉතාමත් සැලසුම් සහගත ව සිදුවූවක් බව ඒ පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් හෙළිවේ. මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ,
(1) ද්විතීක අධ්‍යාපනය ලැබීමට ඇතුළත් සිසුන් අඛණ්ඩ ව වසර පහළොවක් මෙහි අධ්‍යාපනය ලැබිය යුතු විය.
(2) ඉගැන්වීමේ ක්‍රම ශිල්ප වශයෙන් දේශන, සාකච්ඡා හා විවාද යන ක්‍රම භාවිත විය.
(3) පාලි හා සංස්කෘත භාෂාවන් සෑම ශිෂ්‍යයෙක් ම අනිවාර්යයෙන් ම හැදෑරිය යුතු විය.
(4) පශ්චාත් උපාධි පිරිනැමුණේ මෙම විශ්ව විද්‍යාලයේ ම අධ්‍යාපනය හැදෑරූ ශිෂ්‍යයන්ට පමණි.
(5) නේවාසික පහසුකම් සැපයීමට, සේවකයින් හා ගම්වර පාලනයට රාජ්‍ය මැදිහත්වීමක් දක්නට ලැබුණි.

38. හිස්තැනට වඩාත් සුදුසු වරණය තෝරන්න.

පණ්ඩුකාභය රජතුමා සොත්ථිසාලා නම් ශාලා විශේෂයක් ................................ කර දුන් බව මහාවංශයේ සඳහන් වේ.

(1) බ්‍රාහ්මණ ආගමික පිරිස් සඳහා
(2) ජෛන ආගමික පිරිස් සඳහා
(3) ආජීවක ආගමික පිරිස් සඳහා
(4) පරිබ්‍රාජක ආගමික පිරිස් සඳහා
(5) ශිව ආගමික පිරිස් සඳහා

39. ලක්දිවට ථෙරවාදී බුදු දහම ලැබීමත් සමග බුදු දහම වැළඳගත් පළමු පාලකයා බවට පත්වනුයේ දේවානම්පියතිස්ස රජතුමා ය. ඉන් අනතුරුව මෙරට බුදුසසුන ස්ථාපිත කිරීම සඳහාත් එහි චිරස්ථිතිය සඳහාත් එතුමන් බොහෝ සේවාවන් සිදුකරන ලදී. පහත දැක්වෙන සේවාවන් අතරින් එතුමන්ගේ සේවා ලැයිස්තුවට අදාළ නොවන වරණය තෝරන්න.

(1) මහා විහාර සීමා පිහිටුවා මහා විහාරය ඉදි කර බුදු සසුනට පිළිගැන්වූ බව.
(2) චේතියගිරියේ අටසැටලෙන ඉදි කර වස් විසීමට පහසුකම් සැලසූ බව.
(3) භික්ෂුණීන් සඳහා හත්ථාළ්හක මෙහෙණවර ඉදිකරදීම.
(4) බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කර ථූපාරාම ස්තූපය ඉදිකිරීම.
(5) කඨින පූජාව, අරියවංස උත්සවය, වෙසක් උත්සවය ආදිය පැවැත්වීමෙන් බෞද්ධ සංස්කෘතිය පෝෂණය කිරීම.

40. ඉපැරණි ශ්‍රී ලංකාවේ ථෙරවාදී බුදු දහමේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකෙනුයේ මහා විහාරය යි. එයට අදාළ අදාළ ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ.

A විනය සංගායනාවක් පැවැත්වීම
B අටුවා හෙළ බසින් තැබීම.
C ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
D මහා විහාරයට අනුබද්ධව කාලප්‍රාසාද, පියගු වැනි පිරිවෙන් පැවැතීම.
E මූලායතන මඟින් රටපුරා බුදු දහම ව්‍යාප්ත කිරීම.

මේවායින් මහා විහාරයට පමණක් අදාළ ප්‍රකාශන ඇතුළත් වරණය වන්නේ,

(1) A, C හා D ය.
(2) B, C හා E ය.
(3) A, B, C හා E ය.
(4) A, B, C, හා D ය.
(5) A, B, C, D හා E යන සියල්ලෙහිම.

41. අභයගිරිවාසී මහානාග තෙරුන්ට ............................ රජතුමන් විසින් රත්නප්‍රාසාදය නම් වූ ගොඩනැගිල්ල ඉදිකර දෙන ලදී.

(1) කනිට්ඨතිස්ස
(2) වළගම්බා
(3) ගජබා
(4) මහසෙන්
(5) සිරිමෙවන්

42. ථායිලන්තයේ ථෙරවාදී බුදු සමයේ අභිවෘද්ධිය සඳහා රාජ්‍ය මැදිහත්වීම ද තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. ඒ අනුව රාජ්‍ය මැදිහත්වීම පිළිබිඹු කෙරෙන අවස්ථා ගණනාවක් පහත සඳහන් වර්ණයන්හි දැකිය හැකි ය. එම වරණයන් අතර සාවද්‍ය කරුණක් ඇති වර්ණය තෝරන්න.

(1) බෞද්ධ විහාරාරාම පාලනය කිරීම රාජ්‍ය පාලනයට යටත්වේ.
(2) විහාරස්ථානයන්හි ආගමික කටයුතු සඳහා අවශ්‍ය වියදම් රජය විසින් දරනු ලැබේ.
(3) තාවකාලික පැවිද්ද සිදුකරන අවස්ථාවන්හි එහි මුලසුන හොබවන්නේ රටේ රජු විසිනි.
(4) රජයේ ප්‍රධානියා බෞද්ධයෙකු විය යුතුය.
(5) බුදු දහම නඩත්තු කිරීම හා අරක්ෂා කිරීම රාජ්‍යයේ යුතුකමකි.

43. චීනයට බුදුදහම ලැබෙන විට එරට ස්වදේශිකව ගොඩනැගුණ ආගම් කිහිපයක් දක්නට ලැබුණි. එම ආගම් අතුරින් එකක් වන්නේ,

(1) තා- ඕ දහම
(2) ෂින්තෝ දහම
(3) නාත් දහම
(4) අරි දහම
(5) සෙන් දහම





CamScanner

44. ජපානයේ නරා යුගයේ බෞද්ධ සම්ප්‍රදායන් හයක් බුදුදහමට එකතු විය.

A කුසා B ජොජිත්සු C රිත්සු

D හොස්සො E සන්රොන් F කෙංගොන්

යනුවෙන් දැක්වෙන්නේ එම හයයි. මෙවායින් විනය, යෝගාචාර, මාධ්‍යමික සම්ප්‍රදායට අදාළ නිකායන් ඇතුළත් වනුයේ

(1) A, B, C වල ය. (2) B, C, D වල ය. (3) B, D, E වල ය.

(4) A, C, D වල ය. (5) C, D, E වල ය.

45. බුරුමයේ සිට ත්‍රිපිටක දහම හැදෑරීමට මෙරටට පැමිණි ඡප්පට හිමියන් දස වසරකට අධික කාලයක් මහා විහාරයේ ලැගිසිටිමින් ත්‍රිපිටක දහම මැනවින් හදාරා නැවත බුරුමයට වැඩම කළ බව වාර්ථා වේ. එසේ වැඩම කිරීමේ දී ඡප්පට හිමි බුරුමයට ගොස් බිහිකළ නිකාය වන්නේ,

(1) මරම්ම නිකාය (2) සියම් නිකාය (3) ධම්ම යුත්තික නිකාය

(4) රාමඤ්ඤ නිකාය (5) සීහල සංඝ නිකාය

46. මහා පරිනිබ්බාන සූත්‍රයෙහි ස්තූප ගොඩ නැගිය යුතු උතුමන් හතර දෙනෙක් පිළිබඳ ව තොරතුරු වාර්තා වේ. එම හතර දෙනාට අයත් නොවන්නේ කවුරුන් ද?

(1) සක්විති රජ (2) බුදුරජාණන් වහන්සේ (3) පසේ බුදුරජාණන් වහන්සේ

(4) බෝසත් උතුමන් (5) මහරහතන් වහන්සේ

47. මථුරා බුදුපිළිමයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ ලෙස දැක්විය හැක්කේ,

(1) ශාක්‍යසිංහ ලීලාව, විවෘත නෙත්. ස්වභාවික හිසකෙස් ය.

(2) ශාක්‍යසිංහ ලීලාව, විවෘත නෙත්. කැරලිගැසුණු හිසකෙස් ය.

(3) ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්. ස්වභාවික හිසකෙස් ය.

(4) ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්. කැරළිගැසුණු හිසකෙස් ය.

(5) ශාක්‍යසිංහ ලීලාව, මන්දස්මිතය. ස්වභාවික හිසකෙස් ය.

48. මහනුවර යුගයට අයත් දෙගල්දොරු විහාරයේ චිත්‍ර ද සමකාලීන ව දහ අටවන සියවසේ අඳින ලද වෙනත් විහාරවල දක්නට ලැබෙන චිත්‍ර ද සම්ප්‍රදාය හා ශෛලිය අතින් පොළොන්නරුවේ චිත්‍රවලට බෙහෙවින් වෙනස් වේ. එවැනි එක් වෙනසක් ලෙස දැකිය හැකිවන්නේ,

(1) බුද්ධිගෝචර බව යි. (2) තාත්වික බව යි. (3) අක්ෂිගෝචර බව යි.

(4) පර්යාලෝකය දක්වා තිබීම යි. (5) අවකාශය බහුලව යොදා තිබීම යි.

49. ශ්‍රී ලංකාවට බුදු දහම හඳුන්වා දීමෙන් අනතුරුව මෙරට කලා ශිල්ප භාෂා සාහිත්‍යාදී විවිධ ක්ෂේත්‍ර විෂයෙහි බුදුසමයේ ආභාසය නොඅඩුව ලැබුණි. විශේෂයෙන් ම ගද්‍ය පද්‍ය සාහිත්‍ය රචනා කිරීමෙහිලා ජාතක කථා විෂය වී ඇති බව දක්නට ලැබේ. බණ මගක් අනුගමනය කරමින් රචනා වූ කාව්‍යශේඛරය නම් වූ මහාකාව්‍යය නිර්මාණය කිරීමෙහි ලා පාදක වී ඇත්තේ,

(1) මඛාදේව ජාතකය යි. (2) උම්මග්ග ජාතකය යි. (3) වෙස්සන්තර ජාතකය යි.

(4) සත්තුභත්ත ජාතකය යි. (5) කුස ජාතකය යි.

50. ලාංකේය ජන සමාජයේ ජන විඥානය තුළට බෞද්ධ ඉගැන්වීම් සම්ප්‍රේෂණය කිරීමෙහිලා බෞද්ධ ගීත සාහිත්‍යයෙන් ද නොමඳ දායකත්වයක් ලැබී ඇත. එම ගීතයන්ට බොහෝවිට බුද්ධ චරිතය, බුදුදහම මෙන් ම ශාසන ඉතිහාසය වස්තුවිෂය වී ඇති බවක් දැකිය හැකි ය. ඒ අනුව අටලෝ දහම සත්ත්වයාට පොදු ධර්මතාවක් බව ප්‍රකට කරන ගීතයකට උදාහරණයක් වන්නේ,

(1) සංසාරේ බවේ දුකා ......... (2) කවාලා විලඳජාතී .........

(3) සන්නාලියනේ සන්නාලියනේ ........ (4) සොරදෙටුවෙක් කස තැලුම් කකා .........

(5) අඩුකුලේ කියාලා අසරණයා ........





CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

45 S II

# බෞද්ධ ශිෂ්ටාචාරය - II

කාලය පැය 03 යි

නම/ විභාග අංකයඃ

අමතර කියවීම් කාලයඃ මිනිත්තු 10 යි.

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදවන්න.

උපදෙස් -

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකයට ම ලකුණු 20 බැගින් හිමි වේ.

---

## I කොටස

01) (i) වෛශ්‍යය වර්ණයට පමණක් අනන්‍ය වූ ස්වධර්මවලින් හතරක් නම්කරන්න. (ලකුණු 2 යි)

(ii) බ්‍රාහ්මණ සංස්කෘතියේ ප්‍රමුඛ ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 3 යි)

(iii) බ්‍රාහ්මණ වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ගෙනහැර දක්වන්න. (ලකුණු 4 යි)

(iv) බුද්ධකාලීන භාරතයේ පැවැති රාජාණ්ඩු පාලනය පිළිබඳ විවරණයක් සපයන්න. (ලකුණු 5 යි)

(v) අජිත කේසකම්බලී ශාස්තෘවරයාගේ ඉගැන්වීම් බුදු දහමින් විචාරයට ලක්වන අයුරු විස්තර කරන්න. (ලකුණු 6 යි)

02) (i) බුදුරජාණන් වහන්සේ සත්ථා දෙව මනුස්සානං යනුවෙන් හැඳින්වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි)

(ii) සමකාලීනයන් විසින් බුදුරජාණන් වහන්සේ ඇඟයීමට ලක්කළ අවස්ථාවන් නිදසුන් තුනක් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 3 යි)

(iii) බුදුරදුන්ගේ සුවිශේෂී නායකත්ව ලක්ෂණයක් ලෙස යථාවාදී තථාකාරී ගුණය ප්‍රකට කෙරෙන අවස්ථා හතරක් ගෙනහැර දක්වන්න. (ලකුණු 4 යි)

(iv) අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ සැකවින් ඉදිරිපත් කරන්න. (ලකුණු 5 යි)

(v) බුදු දහම සෞන්දර්ය රසාස්වාදය අගය කොට ඇති අයුරු සහේතුකව පෙන්වා දෙන්න. (ලකුණු 6 යි)

03) (i) "කායේන සංවරෝ සාධු ......" යන ධම්මපද ගාථාව නිවැරදි ව සම්පූර්ණ කරන්න. (ලකුණු 2 යි)

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියන්න. (ලකුණු 3 යි)

(iii) මාපිය - දූ දරු සබඳතාවට අදාළ යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 4 යි)

(iv) සූදුවෙහි ආදීනව සිගාලෝවාද සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි)

(v) පුද්ගල දරිද්‍රතාවට අනිසි චර්යාවන් හේතු වන ආකාරය පරාභව සූත්‍රයේ අන්තර්ගත අදාළ කරුණු හයක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 6 යි)





CamScanner

(04) (i) "පාලකයාගේ ප්‍රධාන වගකීම විය යුත්තේ ජනතාවට දැහැමි රැකවරණය සැලසීම හා ආර්ථික සුරක්ෂිතතාව උදාකරලීමයි." බෞද්ධ රාජ්‍ය පාලන මූල ධර්ම ඇසුරෙන් විමසන්න. (ලකුණු 10 යි)

(ii) රටක බොහෝ සාමාජික හා ආර්ථික ගැටලුවලට විසඳුම් ලබාදීමට දස කුසල් උපකාරීවන අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

(05) (i) හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායකවල වැදගත්කම විමසීමට ලක්කරන්න. (ලකුණු 10 යි)

(ii) භෞතික සම්පත්වල හිඟතාව ප්‍රබල සමාජ ප්‍රශ්නයක් බැවින් බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් එයට විසඳුම් ළඟාකරගත හැකි බව පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

(06) (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු පෙන්වා දෙමින් එහි ප්‍රතිඵල ශාසන චිරස්ථිතියට හේතු වූ අයුරු ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10 යි)

(ii) ධර්මාශෝක අධිරාජයාගේ ශාසනික මෙහෙවර නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(07) (i) මහින්දාගමනයට පෙරාතුව මෙරට පැවැති ඇදහිලි හා විශ්වාස බුදුසමයට අනුකූලව හැඩ ගැසුණු ආකාරය විමසුමට ලක්කරන්න. (ලකුණු 10 යි)

(ii) ථායි සංස්කෘතිය පෝෂණය කිරීමට බුදු දහමින් ලැබුණු දායකත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

(08) (i) ලාංකේය කලා ශිල්පීන්ගේ අග්‍රගණ්‍ය නිමවුමක් වූ සඳකඩ පහණෙහි කලාත්මක මුහුණුවර හා ඒ පිළිබඳ විද්වත් මත විවරණය කරන්න. (ලකුණු 10 යි)

(ii) පහත සඳහන් මාතෘකා දෙකකට ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න. (ලකුණු 10 යි)

(1) පංච බලි

(2) වලභි විශ්වවිද්‍යාලයය

(3) ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාව

(4) වාහල්කඩ (ලකුණු 05 x 2 = 10 යි)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi


Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank CamScanner

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තුන්වන වාර පරීක්ෂණය 2026**

**13 ශ්‍රේණිය** **බෞද්ධ ශිෂ්ටාචාරය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(3) | 3 -(5) | 4 -(3) | 5 -(4) | 6 -(1) | 7 -(2) | 8 -(4) | 9 -(5) | 10 -(2) |
| 11 -(5) | 12 -(4) | 13 -(1) | 14 -(3) | 15 -(4) | 16 -(4) | 17 -(2) | 18 -(5) | 19 -(2) | 20 -(3) |
| 21 -(5) | 22 -(2) | 23 -(4) | 24 -(3) | 25 -(2) | 26 -(1) | 27 -(3) | 28 -(5) | 29 -(1) | 30 -(5) |
| 31 -(3) | 32 -(2) | 33 -(1) | 34 -(1) | 35 -(3) | 36 -(3) | 37 -(2) | 38 -(1) | 39 -(5) | 40 -(4) |
| 41 -(1) | 42 -(3) | 43 -(1) | 44 -(5) | 45 -(5) | 46 -(4) | 47 -(2) | 48 -(3) | 49 -(4) | 50 -(1) |

## පිළිතුරු පත්‍රය - II කොටස

### I කොටස

(01) (i) වෛශ්‍යය වර්ණයට පමණක් අනන්‍ය වූ ස්වධර්ම වලින් හතරක් නම්කරන්න.
පශු පාලනය, වෙළදාම, මුදල් පොළියට දීම හා කෘෂි කර්මාන්තය (ලකුණු 2යි)

(ii) බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න.
- සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය පිළිගත් බව.
- ඒ අනුව මහබ්‍රහ්ම, මහා පුරුෂ සංකල්පය හා එය පදනම් කොට ගෙන නිර්මාණය කරන ලද වර්ණාශ්‍රම ධර්ම ආදිය දිව්‍යමය ප්‍රභවයක් ලෙස දැක්වූ බව.
- වේද ග්‍රන්ථ පරම සත්‍ය ලෙස පිළිගත් බව.
- අගාරික ප්‍රතිපදාවක් අනුගමනය කිරීම
- යාගය, පූදසත්කාර, ගීතිකා ගායනය ආදිය මුල්කරගත් කර්ම මාර්ගය ලෞකික ලෝකෝත්තර සැප පිණිස ඒකායන මාර්ගය ලෙස පිළිගත් බව.
- පුද්ගල ස්වච්ඡන්දතාව, ස්වාධීනත්වය දේව නිර්මාණවාදයට යටපත් කළ බව.
- ජන්මීය සාධක මත පුද්ගලයා උසස් හා පහත් යනුවෙන් තීරණය වූ බව.
- කාන්තාවගේ දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික නිදහස අහුරා තැබූ බව.

යනාදී කරුණු වලින් තුනක් පිළිබඳව කෙටියෙන් විස්තර කර තිබීම ප්‍රමාණවත්වේ. (ලකුණු 3යි)

(iii) බ්‍රාහ්මණ වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ගෙනහැර දක්වන්න.
- කාලාන්තරයක් මුළුල්ලේ සමාජය විකාශය වෙමින් පවතින අතර ඇතැමෙක් සමාජයෙහි සිදුවන සාපරාධී ක්‍රියා දැක කලකිරීමට පත් ව සමාජාශ්‍රයයෙන් බැහැර ව දිවි ගෙවීමට කටයුතු කළහ.
- වනගත ව භාවනානුයෝගී පිළිවෙත් අනුගමනය කරමින් ජීවත් වූ මොවුහු බ්‍රාහ්මණ නමින් හැඳින්වූහ. (පාපකෙ අකුසලෙ ධම්මෙ බාහෙන්ති බො වාසෙට්ඨ බ්‍රාහ්මණා)
- බ්‍රාහ්මණයින් කොටස් දෙකකින් යුක්ත වූ බව
- ධ්‍යාන වඩමින් වනගතව වාසයකළ පිරිස ඣායක යනුවෙන් හැඳින්වින.
- ධ්‍යාන නොවඩමින් පන්සල් හදාගෙන පොතපත අධ්‍යනය කරමින් සිටි පිරිස අජ්ඣායක නම් විය. (ලකුණු 4යි)

(iv) බුද්ධකාලීන භාරතයේ පැවැති රාජාණ්ඩු පාලනය පිළිබඳ විවරණයක් සපයන්න.
- මගධ, කෝසල, වත්ස, අවන්ති යනුවෙන් මහාරාජ්‍ය හතරක් පැවති අතර ඒවා ප්‍රධාන රාජාණ්ඩු ලෙස සැලකීම
- මෙම රාජ්‍ය හතර තුළ රාජාණ්ඩු පාලන ක්‍රමය ක්‍රියාත්මක වීම
- රාජාණ්ඩුවක දක්නට තිබූ ප්‍රධාන ලක්ෂණ ලෙෂ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණමයයන සියලු බලතල එක් රජෙකු සතුවීම
- ඒ අනුව නීති පැනවීම, නීති ක්‍රියාත්මක කරවීම, දඬුවම් පැමිණවීමමහරජුගේ කාර්යක් වීම
- ගාමිණී, ග්‍රාමභෝජක, නගරගුත්තික වැනි නිළධාරීන්ගෙන් හා රාජ භාණ්ඩාගාරික, විනිස්චයකාර,අමාත්‍ය, මහා මාත්‍ය යන නිළධාරීන්ගෙන් සමන්විතවීම
- උපරාජ, යුවරාජ, පුරෝහිත, අධිකරණනායක, ඇමැති මණ්ඩලය, සේනාධිපති මගින් බලය ක්‍රියාත්මක කිරීම
- දුර්වල අසල්වැසි රාජ්‍යයන්හි පාලකයින් පරදවා තම බලය පුළුල් කර ගැනීමට මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක කිරීම
- විවාහ සම්බන්ධතා මගින් වෙනත් රාජ්‍යයන් සම්බන්ධ කර තම බලය පුළුල් කර ගැනීම
- පිය පුතු පරම්පරාවෙන් රාජ්‍ය උරුමවීම (ලකුණු 5යි)

(v) අජිත කේසකම්බලී ශාස්තෘවරයාගේ ඉගැන්වීම් බුදු දහමින් විචාරයට ලක්වන අයුරු විස්තර කරන්න.
- දුන් දීහි ඵල නැත. යාගයෙහි ඵල නැත. කුසලා කුසල කර්මයන්ගේ ඵල විපාක නැතැයි දක්වන මොහුගේ ඉගැන්වීම අකිරියවාදී ඉගැන්වීමක් බව.
- දානය, යාගය, හෝමය, මව, පියා, මෙලොව, පරලොව ආදි සියලල් ප්‍රතික්ෂේප කරන මොහු සතර මහා භූතයන් පමණක් ස්ථිර පදාර්ථ ලෙස පිළිගන්නා බැවින් භෞතිකවාදියකු බව.

- මරණින් පසු සත්ත්වයාගේ සතර මහා භූත විශ්වයේ සතර මහා භූතවලට එකතු වන බවත්, දානාදියෙන් යහපතක් නැති බවත් බාල, පණ්ඩිත සියලු දෙනා මරණයෙන් විනාශයට, කෙළවරට පත්වන බවත් දක්වෙන මෙම ඉගැන්වීම උච්ඡේදවාදයක් බව.
- පුද්ගලයා මිය ගිය පසු ඔහු පසු පස ගමන් කරන්නෙක් නැත. ගමන් කරන කර්මයක් නැත. ඔහු සමග යන්නේ ඔහු දමා ඇති පෙට්ටිය පමණි. එය ද ගිනි තැබීමෙන් පසු විනාශ වේ. කිසිවක් ඉතිරි නො වේ.
- එපමණක් නොව මරණින් මතු නැවත පැවැත්මක් නොමැති හෙයින් ණය වී හෝ ගිතෙල් අනුභව කරමින් යෙහෙන් සිටිය යුතු බව ඔවුන්ගේ අදහස විය.
- "යාව ජීවේත් සුඛං ජීවේත් - ඍණං කත්වා ඝෘතම්පිබේත්
  භස්මිං භූතස්ස දේහස්ස - පුනරාගමනං කෘතඃ" (සර්ව දර්ශන සංග්‍රහය)
- පටිච්චසමුප්පන්න ව සත්ත්වයාගේ, ලෝකයේ හටගැනීම හා පැවැත්ම මනාවූ නුවණින් දකින්නාට නාස්තික දෘෂ්ටිය හෙවත් උච්ඡේද දෘෂ්ටිය ඇති නොවන බව. සත්ත්වයාගේ පැවැත්ම මරණයෙන් වසත් නොවන්නේ යැයි අවධාරණය කරන බුදුසමය පුනර්භවය පිළිගන්නා බව.
- කර්ම විපාක සිද්ධාන්තය පිළිගන්නා බුදුසමය පුද්ගලයා විසින් සචේතනව කරනු ලබන කුසලාකුසල කර්මයන්ගෙ 'ඵලවිපාක දිට්ඨධම්මවේදනීයි, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීයි වශයෙන් සංසාරගත ජීවිතය තුළ දී විඳීමට සිදුවෙති යි පවසන බව.
- නත්ථි දින්නං නත්ථි යිට්ඨං ..... ආදි දසවස්තුව මිථ්‍යාදෘෂ්ටියක් ලෙස බැහැර කරන බුදුසමය අත්ථි දින්නං අත්ථි යිට්ඨං අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං ඵලං විපාකෝ .... යනාදි දසවස්තුක සම්මා දිට්ඨියක් මහාචත්තාරීස ආදි සූත්‍රයන්හි දක්වා ඇති බව
- දානා දි සත්ක්‍රියාවල ඵල විපාක ප්‍රතික්ෂේප කිරීම හා සත්ත්වයාගේ සාංසාරික පැවැත්ම බැහැර කිරීම යන අජිතකේසකම්බලි ශාස්තෘවරයාගේ ඉගැන්වීම් සමාජ සදාචාරයෙහි පැවැත්මට ප්‍රබල බාධකයක් බව (ලකුණු 6යි)

02. (i) බුදුරජාණන් වහන්සේ සත්තා දෙව මනුස්සානං යනුවෙන් හැඳින්වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න.

- බුදු රජාණන්වහන්සේ දෙවි මිනිසුනට දිට්ඨ ධම්මික, සාම්පරායික, පරමත්ථ යන ත්‍රිවිධ අර්ථයෙන් සුදුසු පරිදි අනුශාසනා කරන්නාහ යන අරුතින් සත්තා දේවමනුස්සානම් විය
- සත්ත්ව සමූහය භවය නැමැති කාන්තාරයෙන් එතෙර කරවන හෙයින් ද තුන් ලෝකයට ම ගුරුවරයකු වූ බැවින් ද බුදුරජාණන් වහන්සේ සත්ථා නම් වනබව
- බුදුරජාණන් වහන්සේ දෙවි මිනිසුන්ට පමණක් නොව යක්ෂ, නාග, රාක්ෂ ආදීන්ට මෙන් ම තිරිසන්ගත සත්ත්වයන්ට ද අනුශාසනා කොට ඔවුන් දෙවි මිනිස් ආත්ම භවයන්හි උපත ලැබීමට සුදුසු පිරිස 'බවට පත් කොට පසු ව මාර්ග ඵල ලැබීමට තරම් සුදුස්සන් කරවූහ (ලකුණු 2යි)

(ii) සමකාලීනයන් විසින් බුදුරජාණන් වහන්සේ ඇගයීමට ලක්කළ අවස්ථාවන් නිදසුන් තුනක් මගින් පැහැදිලි කරන්න.

- කොණ්ඩඤ්ඤ, සාරිපුත්ත, රට්ඨපාල ආදි මහ තෙරවරුන් විසින් බුදුරදුන් ඇගයීමට ලක් කරනු ලැබ ඇති බව.
- වංකී, සෝණදණ්ඩ, අස්සලායන ආදි බ්‍රාහ්මණ පඬිවරුන් ද, වච්ඡගොත්ත, පොට්ඨපාද, චූලසකුල්දායි, උපාලි ආදි වෙනත් ආගමිකයන් ද බුදු රජාණන් වහන්සේ ඇගයීමට ලක් කළ අවස්ථා සූත්‍ර ධර්මවල සඳහන් වන බව.
- කෝසල, බිම්බිසාර, අජාසත්ත වැනි මහ රජවරුන් ද සුදත්ත සිටු, අභයරාජ කුමරු වැනි පිරිස් ද විසින් බුදුරදුන් පැසසුමට ලක් කරන ලද බව.
- බුදුරදුන් මනුෂ්‍යයන්ගේ පමණක් නොව දෙවිවරුන්ගේ ද වර්ණනාවට ලක් වූ අයුරු මහා ගෝවින්ද සූත්‍රය ආදි සූත්‍රවලින් පැහැදිලි වන බව. (ලකුණු 3යි)

(iii) බුදුරදුන්ගේ සුවිශේෂී නායකත්ව ලක්ෂණයක් ලෙස යථාවාදී තථාකාරී ගුණය ප්‍රකට කෙරෙන අවස්ථා හතරක් පෙන්වා දෙන්න.

- තමා බුද්ධත්වයට පත්වූයේයැයි ප්‍රකාශකළවිට පස්වග මහණෝ විශ්වාස නොකළහ. එහිදී බුදුරදුන් මීට පෙර තමන් එසේ කියා ඇත්දැයි පස්වග මහණුන්ගෙන් පශ්න කළ බව මහාවග්ග පාලියේ දැක්වේ.
- උන් වහන්සේ අන් අයට නිර්වාණගාමී මාර්ගයේ ගමන්කරන ලෙස දේශනා කළේ තමා එම මග ගමන්කොට නිවන් පසක් කර ගැනීමෙනි.
- පව් නොකරන්නයැයි උන් වහන්සේ දේශනා කළේ තමා රහසින්වත් පව් නොකොට අරහං ගුණයෙන් යුතුව වෙසෙමිනි.
- එක් වේලක් පමණක් වළඳන ලෙෂ භික්ෂු භික්ෂුණීන්ට විකාලභෝජන ශික්ෂාපදය පැනවූයේ තමා ඒකාශන භෝජනය වළඳමින් එහි ඇති අල්පාබාධ ගුණ අත්දැකීමෙන් විඳිමිනි. (ලකුණු 4යි)
- ප්‍රථම රහතුන් හැට නමට තනි තනිව ධර්මදූත සේවාවේ නිරතවන ලෙසට උපදෙස් තමන් වහන්සේ ද තනිව උරුවෙල් දනව්වට වැඩම කිරීම.

- වර්ණභේද, කුලභේද, සංකල්පය අර්ථ ශූන්‍ය වූවක් බව දේශනා කරමින් බුදු රදුහු එය ක්‍රියාවෙන් ම සනාථ කළහ.
- යමක් නොකරන්නයැයි සිය ශ්‍රාවකයින්ට දේශනා කළේ උන් වහන්සේ එය නොකරමින් ය.

(iv) අනේපිඩු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ සැකවින් ඉදිරිපත් කරන්න.

- අනතිමානීකම - තමන් විසින් ඉදි කළ ජේතවනාරාමයට ජේත කුමරුගේ නම යෙදීම.
- නිර්ලෝභීත්වය - සසුන වෙනුවෙන් පනස් හතර කෝටියක් වියදම් කොට ජේතවනාරාමය ඉදි කිරීම.
- ශාසනික ලැදියාව - බුද්ධ ප්‍රමුඛ සංඝයා උදෙසා නිතිපතා දන් පූජා කිරීම, ආනන්ද බෝධි රෝපණය, විහාරයට යන විට හිස් අතින් නොයෑම.
- ඥාති හිතමිත්‍රාදීන් දහමට යොමු කිරීමට උත්සාහ ගැනීම - තම කාල සිටු පුත්‍රයා දහමට යොමු කිරීම.
- දියණියන්ගෙන් මහා සුභද්‍රා, චූල සුභද්‍රා සෝවාන් වීම, කනිටු දියණිය වන සුමනා දාන ශාලාව භාරව ක්‍රියා කළ අතර ඇය සකෘදාගාමී තත්ත්වයට පත් වීම.
- පරිත්‍යාගශීලීත්වය - අනාථ අසරණ අයට පිහිට වීම නිසා අනාථපිණ්ඩික ලෙස හැඳින්වීම.

(ලකුණු 5යි)

(V) බුදු දහම සෞන්දර්ය රසාස්වාදය අගය කොට ඇති අයුරු පෙන්වා දෙන්න.

- සෞන්දර්ය ස්වභාව හා නිර්මාණාත්මක වශයෙන් දෙයාකාරවන අතර මෙම දෙයාකාර සෞන්දර්යම ඇගයීමට ලක්වී ඇති අයුරුසූත්‍ර පිටකය තුළින් හඳුනාගත හැකි බව.
- බුදුරදුන් චාපාල, සත්තම්බක, සාරන්දද ආදී ස්ථාන ඇගයීමට ලක්කිරීම.
- බවුන් වැඩීම සඳහා උරුවෙල් දනව්වේ සොඳුරු පරිසර පද්ධතියක් තෝරාගැනීම හා එය ඇගයීමට ලක්කිරීම.
- පඤ්චසිකගේ වීනාවාදනය ඇගයීම ආදී වශයෙන් බුදු රදුන් ස්වභාව හා නිර්මාණාත්මක සෞන්දර්ය රසවිඳි අවස්ථාවන් ගෙනහැර දැක්විය හැකිය.
- සප්පක, වනවච්ච, කාළුදායි, තාලපුට ආදී රහතන් වහන්සේලා විසින් ඉදිරිපත්කළ ථේර ගාථා තුළින් ද සෞන්දර්ය රසවිඳි අයුරු හඳුනාගත හැකිය. (ලකුණු 6යි)

03. (i) "කායේන සංවරෝ සාධු ...... යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න.

"කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු - සාධු සබ්බත්ථ සංවරෝ
සබ්බත්ථ සංවුතෝ භික්ඛු - සබ්බදුක්ඛා පමුච්චති" (ලකුණු 2යි)

(ii) එම ගාථාවේ අර්ථය නිවැරැදිව ලියන්න.

කයෙන් සංවර වීම යහපත් ය. වචනයෙන් සංවර වීම යහපත් ය. සිතෙන් සංවර වීම යහපත් ය. සියලු තැන්හි ම සංවර වීම යහපත් ය. සියලු තැන්හි සංවර වූ (සදොර ම රැකි භික්ෂුව) සියලු දුකෙන් මිදේ.

(ලකුණු 3යි)

(iii) මාපිය - දූ දරු සබඳතාවට අදාල යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න.

<u>දූ දරු යුතුකම්</u>

1. මවුපියන් පෝෂණය කිරීම - භතෝ නේසං කරිස්සාමි
2. ඔවුන්ගේ කටයුතු සොයාබලා ඉටුකරදීම - කිච්චං නේසං කරිස්සාමි
3. දෙමවුපියන් රැකගෙන ආ කුලපරපුර හා ඊට සම්බන්ධ සිරිත් විරිත් ආරක්ෂා කිරීම - කුල වංසං ඨපෙස්සාමි
4. දෙමවුපියන්ගෙන් උරුම වූ දේ පිළිගෙන රැක ගැනීම - දායජ්ජං පටිපජ්ජාමි
5. මවුපියන් මියගිය පසු පින්කම් කොට පින් අනුමෝදන් කරවීම - අථ වා පන පේතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි

<u>දෙමව්පිය යුතුකම්</u>

1. දරුවන් පවින් වලකා ගැනීම. - පාපා නිවාරෙන්ති
2. ඔවුන් යහපත් කටයුතුවල යෙදවීම - කල්‍යාණේ නිවේසෙන්ති
3. ඔවුන්ට නිසි අධ්‍යාපන හා ශිල්පීය දැනුම ලබා දීම - සිප්පං සික්ඛාපෙන්ති
4. සුදුසුකල ආවාහ විවාහ කටයුතු කරදීම - පතිරූපේන දාරේන සංයෝජෙන්ති
5. දෙමවුපියන් සතු සම්පත් සුදුසුකල දරුවන්ට පවරා දීම - සමයේ දායජ්ජං නියයාදෙන්ත

(ලකුණු 4යි)

(iv) සුදුවෙහි ආදිනව ආදිනව සිගාලෝවාද සූත්‍රානුසාරයෙන් පැහැදිළි කරන්න.

සිගාලෝවාද සූත්‍රයේ සූදුවෙහි ආදීනව හයක් දක්වා ඇත. පහත දැක්වෙන එම කරුණු පිළිබඳව කෙටි විවරණයක් ඉදිරිපත්විය යුය. නම් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. නම් කිරීමට ලකුණු දෙකක් ලබා දෙන්න.

1. දිනන්නා පරාජිතයාගේ වෛරයට භාජනය වේ. - ජයං වේරං පසවති
2. පැරදුන පුද්ගලයා නැති වූ වස්තුව පිළිබඳ ව ශෝක කරයි - පරාජිතෝ විත්තමනුසෝචති
3. බලා සිටියදී ම ධනය විනාශ වේ - සන්දිට්ඨිකා ධනඤ්ජානි
4. සමාජය ඔහුගේ වචනය නො පිළිගනී - සභාගතස්ස වචනං න රූහති
5. මිතුරන්ගේ අප්‍රසාදයට භාජනය වේ. - මිත්තාමච්චානං පරිභූතෝ හෝති
6. ආවාහ විවාහ සඳහා නො පතන ලද්දෙක් වේ - ආවාහ විවාහකානං අපත්ථිතෝ හෝති

(V) පුද්ගල දරිද්‍රතාවයට අනිසි චයාවන් හේතු වන ආකාරය පරාභව සූත්‍රයේ අන්තර්ගත අදාල කරුණු හයක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

- පුද්ගල දරිද්‍රතාව හෙවත් දිළිඳුකමට ඔවුන්ගේ වැරදි චර්යා රටාවන් ද බලපාන බව
- පරාභව සූත්‍රයේ ඇතුලත්
- නිතර නිදන සුළුබව, දොඩමලුව පිරිස සමග කාලය ගතකිරීම, උට්ඨාන වීර්යෙන් තොර වීම අලසකමින් යුක්ත වීම
- ස්ත්‍රීන් කෙරෙහි ලොල් වීම, සුරාවෙහි ලොල් වීම. දූ කෙලියෙහි ලොල් වීම
- යමෙක් තම බිරිඳගෙන් (භාර්යාවගෙන්) සතුටට පත් නො වූයේ වෙසඟනන් වෙත යයිද, පර අඹුවන් වෙත යයි ද එය පිරිහීමට හේතුවකි.
- සුරාව, සූදුව, මස්මාංශ ආදියෙහි ලොල් වූ ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හෝ (තම වස්තු) පරිපාලනයෙහි යොදවයිනම් එය පිරිහීමට හේතුවකි.

යනාදී කරුණු මූල්කරගෙන පුද්ගල දිළිඳුකම හටගැනෙන බව විස්තර විය යුතුය. (ලකුණු 6යි)

## II කොටස

04. (i) "ජනතාවට දැහැමි රැකවරණය හා ආර්ථික සුරක්ෂිතතාව උදාකරලීම රජුගේ ප්‍රධාන වගකීමකි" බෞද්ධ රාජ්‍ය පාලන මූල ධර්ම ඇසුරෙන් විමසන්න.

- දැහැමි සමාජයක් උදෙසා මෙන්ම ජනතාවට දැහැමි රැකවරණය හා ආර්ථික සුරක්ෂිතතාව සැලසීම උදෙසා පළමුව පාලකයා දැහැමි විය යුතුබව.
- ඇතැම් පාලි සූත්‍රවල ධම්මිකෝ ධම්මරාජා යන ප්‍රයෝගය දක්නට ලැබීම.
- රජු අදැහැමි වූ කල්හි මැති ඇමැතින් මෙන්ම රටවැසියාද අධාර්මික වේ. කලට වැසි නොවැසීම ආදී ස්වභාවික විපත් සිදුවී රාජ්‍ය බිඳවැටෙන බව අධම්මික සූත්‍රයෙහි දැක්වෙන බව.
- ජනතාවට දැහැමි රැකවරණය හා ආර්ථික සුරක්ෂිතතාව ඇතිකිරීමට රාජ්‍ය මැදිහත්වීම කූටදන්ත සූත්‍රයෙන් අවධාරණය කෙරේ.
- දස සක්විතිවත්, දසරාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානීය ධර්ම, පංචසීල ප්‍රතිපදාව, සතර අගතියෙන් තොරවීම ආදිය ජනතාවට දැහැමි රැකවරණය සලසමින් දැහැමි සමාජයක් ගොඩ නැගීමේ බෞද්ධ දේශපාලන ප්‍රතිපත්ති බව.
- කූටදන්ත සූත්‍රයේ දැක්වෙන ජනතාවගේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් පාලකයා විසින් ඉටුකළ යුතු යුතුකම්
  - ➢ කෘෂිකර්මාන්තයෙහි නිරතවන්නන්ට පොහොර, බීජ, ආදිය ලබාදීම.
  - ➢ රාජ්‍ය සේවකයින්ට බත් වැටුප් ලබාදීම.
  - ➢ වෙළෙන්දන්ට ප්‍රාග්ධන පහසුකම් ලබාදීම.
  - ➢ ආර්ථික අපහසුතා ඇති අවස්ථාවලදී බදු සහන ලබාදීම.
  - ➢ ආර්ථික පරිහානියට හේතුවන ඇතැම් ක්‍රියාවලින් වැළකීම.
- දස සක්විතිවත්වල දිළින්දන්ට ධනය දීම.
- සතර සංග්‍රහ වස්තුවල සඳහන් දානය හා අර්ථචර්යාව තුළින් රටක සමෘද්ධිය උදාකර වීම.
- දසරාජ ධර්මවල එන දානය, පරිත්‍යාගය වැනි පිළිවෙත් අනුගමනය කිරීමෙන් ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කිරීම.

(ii) රටක බොහෝ සාමාජික හා ආර්ථික ගැටලුවලට විසඳුම් ලබාදීමට දස කුසල් උපකාරීවන අයුරු පෙන්වා දෙන්න.

- ප්‍රාණඝාතයෙන් තොරවූ සමාජයක් තුළ ගොඩනැගෙන සාමකාමී පරිසරය වටහාගැනීම අසීරුනොවනු ඇත. බියෙන් සැකෙන් තොරව නිදහසේ කටයුතු කිරීමට හැකියාව ඇතිවන අතර මිනිසුන් තුළ මෛත්‍රී සහගත සිතුවිලි ජනිත වනු ඇත. එවිට එකිනෙකා කෙරෙහි මිත්‍රසීලීව කටයුතු කිරීමට අවස්ථාව උදාවේ.
- එකිනෙකා තුළ අන්‍යොන්‍ය සහයෝගය, සුහදත්වය වර්ධනය වන අතර ප්‍රචණ්ඩත්වය, ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය පළිගැනීම වැනි දූෂිත මනෝභාවයන් දුරස්වී යහපත් සමාජයක් නිර්මාණය වීමට අවස්ථාව උදාවේ.
- ප්‍රාණඝාතයේ නොයෙදීම මහා ධර්මපාල ජාතක කතාවේ සඳහන් ආකාරයට මිනිසුන් අඩු ආයුෂ ඇතුව මරණයට පත්නොවීමටත් චූල්ලකම්ම සූත්‍රයේ සඳහන් ආකාරයට දීර්ඝ ආයුෂ ගතකිරීමටත් අවස්ථාව උදාවන බවත් විස්තර කළ හැකි ය.
- මේ ආකාරයට අන්සතු දේ පැහැරගැනීමෙන් තොරව අන්‍යයන්ගේ සම්පත් ආරක්ෂාකර ගැනීමට පෙළඹීම තුළින් සාමකාමී පරිසරයකට අවස්ථාව උදාවන අයුරුත් වැරදි කාමසේවනයෙන් බැහැරව ස්වදාර සංතුට්ඨියෙන් යුතුව කටයුතු කිරීම තුළින් සාමකාමී පවුල් ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවන බවත් ආදී වශයෙන් සෙසු කුසල කර්මයන් පිළිබඳවත් අවධානය යොමු කරමින් පිළිතුර සකස්වී තිබීම ප්‍රමාණවත් ය.
- සොරකමෙන් , කාමයෙහි වරදවා හැසිරීම, බොරුව, අභිද්‍යා, ආදියෙන් තොරවීම තුළින් ආර්ථික සංවර්ධනය ද උදාකර ගැනීමට අවස්ථාව උදාවන බව (ලකුණු 10යි)

## පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස

05. (i) හොඳ නරක විනිශ්චය කිරීමෙහිලා භාවිත බෞද්ධ නිර්ණායකවල වැදගත්කම විමසීමට ලක්කරන්න.

- අංගුත්තර නිකායේ ආධිපතෙය්‍ය සූත්‍රයේ සඳහන් අධිපති ධර්ම තුන සැළකිල්ලට ගැනීම.
  1. අත්තාධිපතෙය්‍ය (ක්‍රියාවක් සිදුකිරීමට පෙර තමා අධිපතිකොට සලකා)
  2. ලෝකාධිපතෙය්‍ය (ලෝකය හෙවත් තමා අවට සමාජය අධිපතිකොට සලකා)
  3. ධම්මාධිපතෙය්‍ය (ධර්මය අධිපතිකොට සලකා)
- සංයුක්ත නිකායේ වේළුද්වාර සූත්‍රයේ සඳහන් අත්තූපනායික ධර්ම පර්යායට අනුව
- අම්බලට්ඨික සූත්‍රයේ සඳහන් නිර්ණායකයන්ට අනුව - කැඩපතකින් බලා සිරුර සකස්කරගන්නාක් මෙන් සිදුකිරීමට යන ක්‍රියාව තමාගේ අයහපත පිණිස හේතුවේද? අනුන්ගේ අයහපත පිණිස හේතුවේද? තමන්ගේ හා අනුන්ගේ අයහපත පිණිස හේතුවේදැයි නැවත නැවත සිතා කළයුත්ත නොකළ යුත්ත තීරණය කිරීම.
- ධම්ම පදයේ දක්වෙන පරිදි පදුට්ඨ මනසින් හෙවත් නරක චේතනාවෙන් කියන කරන අකුසල කර්මයන්ට ලැබෙන දුක් විපාක ගොනුපස පස එන රිය සක මෙන් පීඩාකාරීවන බව. එසේම ප්‍රසන්න මනසින් හෙවත් යහපත් චේතනාවෙන් කියන කරන කුසල කර්මයන්ට ලැබෙන සැප විපාක තමා පසුපස එන සෙවනැල්ල මෙන් සුවදායක බව
- "ධම්මපදයේම සඳහන් න තං කම්මං කතං සාධු ---" යන ගාථාවෙන් දක්වෙන පරිදි පසුතැවීමෙන්, කඳුලු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවන ක්‍රියා නොකිරීම මැනවි. එසේම "තඤ්ච කම්මං කතං සාධු---" ගාථාවෙන් දක්වෙන පරිදි යමක් කොට පසුතැවීමට සිදු නොවේද සතුටු සිතින් විපාකය විඳිය හැකිවේද එවැනි ක්‍රියා සිදුකිරීම මැනවි.
- කාලාම සූත්‍රයේදී අනුස්සවය, පරම්පරාව, පිටක සම්ප්‍රදාය ආදී නිර්ණායක ප්‍රාමාණික වශයෙන් නොසලකා පුද්ගලයෙකු ක්‍රියාකළයුතු ආකාරය පැහැදිලි කරමින් මෙය කුශලය සඳහා හේතුවේ මෙය අකුසලය සඳහා හේතුවේ යනුවෙන් විමසා බලා තීරණයකට එළඹෙන ලෙස දක්වීම.

(ලකුණු 10යි)

(ii) භෞතික සම්පත්වල හිඟතාව ප්‍රබල සමාජ ප්‍රශ්නයක් බැවින් බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් එයට

- විසඳුම් ළඟාකරගත හැකි බව පෙන්වා දෙන්න.
- ලෝකයේ සම්පත් අසීමිතව නොමැත. ඇත්තේ සීමාසහිතවය.
- සීමාසහිත සම්පත්වලින් අසීමිත වුවමනාවන් සහ ආශාවන් තෘප්තිමත් කළ නොහැක.
- එම සීමා සහිත සම්පත් පුද්ගලයාගේ පැවැත්මට ප්‍රමාණවත් බව බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනයෙන් පැහැදිළිවේ.
- විශේෂයෙන් අල්පේච්ඡ ජීවිතය, සැහැල්ලු දිවි පැවැත්ම, සුභරතාවයෙන් යුක්තවීම, අරපිරිමැස්ම එහිදී ප්‍රධාන වේ.
- සම්පත් කළමනාකරනයට අදාල බෞද්ධ ඉගැන්වීම් සියල්ලම පාහේ උක්ත ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් දැක්විය හැකිය.

(ලකුණු 10යි)

06. (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු පෙන්වා දෙමින් එහි ප්‍රතිඵල ශාසන

- විරස්ථිතියට හේතු වූ අයුරු ඇගයීමට ලක්කරන්න.
- චුල්ල වග්ගපාලියේ සත්තසතිකඛන්ධකයට අනුව දෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට අදාල හේතුව වශයෙන් දක්වෙනුයේ වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත්කරන ලද දසවස්තුවයි.
- පාචීනක හා පාවෙය්‍යක යන ප්‍රදේශ දෙකෙන් ධර්මධර විනයධර භික්ෂූන් වාසය කරන්නේ කොහේද යන ගැටලුවද මෙයට පදනම් වූ කරුණක් ලෙස දක්වේ.
- මහාදේව නම් හිමිනමක් විසින් රහතන් වහන්සේලා අවතක්සේරුවකට ලක්කරමින් ඉදිරිපත් කරන ලද කාරනා පහක් ද මේ සඳහා හේතු වූ බව සඳහන්වීම.
- දසවස්තුව පිළිනොගත් කාකණ්ඩ පුත්ත යස හිමියන්ට වජ්ජිපුත්තක භික්ෂූන් දක්වූ දැඩි විරෝධය
- විවිධ මාර්ගයෙන් ලැබුන අවබෝධය නිසා කාලාශෝක රජුට ඇතිවූ සසුන පිරිසිදු කිරීමේ අවශ්‍යතාව
- වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත්කරන ලද දසවස්තුව සබ්බකාමි මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රැස්වූ සංඝ සම්මේලනයේදී ධර්ම විනය විරෝධී අකැප වස්තුවක් සේ එකිනෙක විශ්ලේෂණය කොට ප්‍රතික්ෂේප කිරීම.
- දසවස්තුවක් ප්‍රතික්ෂේප වීමත් සමග ශාසන චිරස්ථිතිය සඳහා එය ඉවහල්වීම.
- වසර සියයක් මුළුල්ලේ අවිච්ඡින්නව පැවති ථෙරීය භික්ෂු පරම්පරාව ථෙරවාද හා මහා සාංඝික වශයෙන් දෙකොටසකට බෙදී මින් ඉදිරියට ක්‍රියාත්මක වීමට යොමුවීම.
- මෙයින් පසුව ක්‍රමයෙන් භික්ෂු සාමග්‍රිය බිඳීගොස් නිකාය සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වෙමින් නව දාර්ශණික සංකල්ප ඒ හරහා සසුනට ඇතුලත්වීම.

(ලකුණු 10යි)

(iii) ධර්මාශෝක අධිරාජ්‍යයාගේ ශාසනික මෙහෙවර නිදසුන් මගින් පැහැදිලි කරන්න.

- අශෝක රජතුමා මොග්ගලී පුත්තතිස්ස හිමියන්ගේ උපදෙස් ලබමින් ශාසනික සේවාවට යොමුවිය.
- දුසිල් මහණුන් 60000ක් සසුනෙන් නෙරපා භේද භින්නව සිටි භික්ෂූන් සමගි කරවා ශාසන සංශෝධනයක් සිදු කොට තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය දැක්වීම.
- භාරතයේ විවිධ ප්‍රදේශ සහ විදේශ රටවල් කිහිපයකම ධර්මය ව්‍යාප්ත කිරීම පිණිස ධර්මදූත කණ්ඩායම් පිටත්කර යැවීම.
- වෙහෙර විහාර රාශියක් කරවූ බව මහා වංශය ආදී වංශකතා සාහිත්‍යයන්හි සඳහන්ව ඇති අතර සාංචි ස්තූපය එතුමා විසින් ගොඩනංවන ලද ප්‍රධාන ස්තූපය වීම.
- සෙල්ලිපි පුවරු ලිපි ටැම් ලිපි ආදිය මගින් හා ධර්ම මහාමාත්‍යවරුන් මගින් බුදු දහමේ එන ඉගැන්වීම් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කිරීම (යුක්තක රජ්ජුක වැනි පුද්ගලයින් පත් කිරීම)
- කථාවත්ථුප්පකරණය රචනාකිරීමට මොග්ගලීපුත්ත තිස්ස තෙරුන්ට පහසුකම් සැළස්වීම.
- කුමර පුත්‍රයා දියණිය සසුන්ගත කොට විදේශ ධර්ම දූත සේවාවේ යෙදවීම.
- ලුම්බිනිය, සාරානාත්, ආදී බුද්ධ චරිතය හා සම්බන්ධ වැදගත් ස්ථාන වන්දනා කරමින් ඒ ස්ථාන දියුණු කොට අශෝක ස්ථම්භ පිහිටුවීම.
- පසුවසිල ප්‍රතිපත්තිය අභය, දානය මිනිසුන් සඳහා මෙන්ම සතුන් සිව්පාවුන් සඳහාද ආරෝග්‍යශාලා ඉදිකිරීම මල්වතු උයන් වතු ඉදිකිරීම් ආදී කටයුතු මගින් සිදුකළ ශාසනික මෙහෙවර ආදී උදාහරන සහිතව දක්වාලිය යුතුය. (ලකුණු 10යි)

07. (i) මහින්දාගමනයට පෙරාතුව මෙරට පැවැති ඇදහිලි හා විශ්වාස බුදුසමයට අනුකූලව හැඩ ගැසුණු ආකාරය විමසුමට ලක්කරන්න.

- ➢ පැරණි ලක්දිව ඇදහිලි හා විශ්වාස රාශියක් පැවැති බව ඓතිහාසික වාර්තා අනුව පැහැදිලිවේ.
- ➢ වෘක්ෂ වන්දනය
- ➢ යක්ෂ වන්දනය
- ➢ දේව වන්දනය
- ➢ නාග වන්දනය
- ➢ මළවුන් වන්දනය
- ➢ ග්‍රහ වස්තු වන්දනය
- බුදුසමයේ පැමිණීමත් සමග මෙම ඇදහිලි හා විශ්වාසයන්ගෙන් ඇතැම් ඒවා නව මුහුණුවරකින් ඉදිරිපත් වූ අතර ඇතැම් ඒවා ක්‍රමයෙන් අභාවයට පත්විය.
- වෘක්ෂ වන්දනය බෝධිවන්දනය බවට පත්වීමත්
- යක්ෂ වන්දනය තුළින් සෙතක් ඇති නොවන බවත් පහත් ආත්මභාව ලැබූ අය ඉන් මුදවා ගැනීම සඳහා පින් දහම්වල නිරතවීම අවශ්‍ය බවත් පෙන්වා දීම.
- යක්ෂයින් බුදුරදුන් හමුවේ දැමුණු පිරිසක් බවට පත් වූ අවස්ථා ඉදිරිපත් වීම.
- තිසා වැවට අරක්ගත් යක්ෂයෙක් මිහිඳු හිමියන් විසින් දමනය කොට බුදු සමයේ අනුග්‍රාහකයෙකු බවට පත් කිරීම.
- පේතවත්ථු විමානවත්ථු බාල පණ්ඩිත දේවදූත යනාදී දේශනා තුළින් ලක්වැසියන් අතර පැවැති මළවුන් පිදීම හා දේවන්දනයට නව අරුත් ගැන්වීම.
- මළවුන් හා දේවන්දනය වෙනුවට ඉෂ්ට දේවතාවවන්ට පින්දීම.
- නාග වන්දනය වෙනුවට නාගයාට ගරු කිරීම.
- ස්තූපය හඳුන්වා දීම හා ශෛලමය බුද්ධ ප්‍රතිමා නිර්මාණය තුළින් පැවති පර්වත වන්දනයට නව අර්ථ සැපයීම.
- ගිණි දෙවියන් පිදීම වෙනුවට පහන් පූජාව ඇතිකිරීම.
- ගාංකිකයන් බුදු සමය වැළඳගැනීමත් සමග දඩයමේ යෑම වැනි නැකත් කෙළි සපුරා අභාවයට ගිය අතර ඒ වෙනුවට අභයදාන කටයුතු මාසාන ආඥාව පැනවීම වැනි ක්‍රියාකාරකම් ද බෞද්ධාගමික උත්සවද ආරම්භවීම. (ලකුණු 10යි)

(ii) ථායි සංස්කෘතිය පෝෂණය කිරීමට බුදු දහමින් ලැබුණු දායකත්වය පරීක්ෂා කරන්න.

- සියලුම පිරිමින් තාවකාලිකව හෝ පැවිදිව සිටිය යුතුවීම පැවිදිව සිටිබවට ලැබෙන සහතිකය විවාහයේදී හා රැකියාවේදී වැදගත්වීම.
- දිනපතා උදෑසන පිණ්ඩපාතයේ වඩින භික්ෂූන් වහන්සේලා ලක්ෂ ගණනකට මහජනතාව ශ්‍රද්ධාවෙන් පිණ්ඩපාතය පිළිගැන්වීම.
- බෞද්ධ විහාරාරාම පාලනය කිරීම, රජයේ පාලනයට යටත්වන අතර විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් රජය විසින් දරීම.
- ක්‍රමවත් සංඝ සංවිධානයක් පවතින අතර එහි ප්‍රධානියා රජය විසින් පත්කරන ලද සංඝ රාජයන්වහන්සේ වීම.
- ථායි ජනතාව දෛනිකව ආගමික කටයුතුවල නිරතවීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස්කරගෙන එම පූජාකටයුතුවල නිරවීම.
- මෙරට ලොකු කුඩා සෑම අයෙකුගේම ගෙලෙහි බුද්ධ රූපයක් පැළඳගෙන සිටීම සුලභ දර්ශනයක්වන අතර එය සකස්කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේවීම.
- ථායි විහාරස්ථානවල පැවිදි පිරිස් මෙන්ම බහුල ව ළමයින්ද වාසය කිරීම.

- වාර්ෂිකව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවය හා කඨින පූජෝත්සවය ප්‍රමුඛ වන අතර කඨින චීවරය රැගෙන යන පෙරහැර ජාතික ක්‍රීඩාවලින් සමන්විතවීම.
- අධ්‍යාපනය කලාශිල්ප හා සාහිත්‍යයද බුදු දහමින් පෝෂණය වී සංස්කෘතිය පෝෂණය කරලීමට දායකවීම.

(ලකුණු 10යි)

08. (i) ලාංකේය කලා ශිල්පීන්ගේ අග්‍රගණ්‍ය නිමවුමක් වූ සඳකඩ පහණෙහි කලාත්මක මුහුණුවර හා ඒ පිළිබඳ විද්මත් මත විවරණය කරන්න.

- හෙළ කලාකරුවාගේ විශිෂ්ටතම නිමැවුම් අතර සඳකඩපහණට ප්‍රමුඛත්වයක් හිමි වන බව
- ඉන්දියාවේ පාටිකා නමින් හැඳින්වුණ සඳකඩපහණ ලංකාවේ අඩ්ඪ චන්ද පාෂාණ, අඩසඳ පහණ, අඩ්ඪ චන්ද පදගණ්ඨිකා යන නම්වලින් ද හැඳින්වෙන බව  මුල් කාලයේ බෞද්ධ ගොඩනැගිලිවලට ප්‍රවේශ වීමට ඇති පියගැටපෙළ පාමුල තිබූ අර්ධ කවාකාර ගල් පඩිය සඳකඩපහණ නමින් හැඳින්වූ
- ලාංකේය සඳකඩපහණ ආරම්භක වකවානුවේ කැටයම් විරල වාම් එකක් වූ අතර ක්‍රමයෙන් එයට කැටයම් එකතු වී ඇති බව
- බෞද්ධ ලෝකයේ විශිෂ්ටතම සඳකඩපහණ නිර්මාණය කිරීමේ ගෞරවය අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ සිටි කලාකරුවන්ට හිමි වන බව
- මෙම යුගයේ කලාත්මක බවින් අනූන සඳකඩපහණ කිහිපය අතරින් ප්‍රමුඛ වන්නේ බිසෝ මාලිගාව අසල පිහිටි සඳකඩපහණ බව
- ඊට අමතර ව මහසෙන් මන්දිරයෙහි ඇති සඳකඩපහණ, ථූපාරාමයට ආසන්නයේ දළදා මාලිගා ගොඩනැගිල්ලෙහි ඇති සඳකඩපහණ හා ශ්‍රී මහා බෝධියේ උතුරු ගෝපුරයේ ඇති සඳකඩපහණ ද කලාත්මක ඒවා බව
- අනුරාධපුර සඳකඩපහණට වඩා පොළොනරුව යුගයෙ 'සඳකඩපහණ කරුණු කිහිපයකින් වෙනස් වන බව
- උගතුන්ගේ මතයට අනුව මෙම සඳකඩපහණෙහි ඇතුළත් කැටයම් හුදෙක් අලංකාරය සඳහා පමණක් නිමවන ලද ඒවා නොවන අතර ඉන් කිසියම් අරුතක් සන්නිවේදනය කෙරෙන බව
- ඒ මත ඉදිරිපත 'කරන්නන 'අතර එච්.සී.පී.බෙල්' එස්.පරණවිතාන, ඩී.ටී.දෙවේන්ද්‍ර, වින්සන්ට් ස්මිත්, විනී විතාරණ, විලියම් ඊ වෝඩ් ප්‍රධාන වන බව
- සඳකඩපහණ පිළිබඳ ව මුල් ම මතය ඉදිරිපත් කළ බෙල් මහතා එහි එක් පෙළට ගමන් කරන සතුන් හතර දෙනාගෙන් සතර දිසාව සංකේතවත් කෙරේ යැයි පවසන බව
- සඳකඩපහණෙහි ඇති සියලු කැටයම් සැලැකිල්ලට ගෙන ගැඹුරු අර්ථකථනයක් ඉදිරිපත් කළ සෙනරත් පරණවිතාන මහතා එය භව චක්‍රය ලෙස හඳුන්වා දෙන බව
- එම අර්ථකථනයට අනුව අනුරාධපුර සඳකඩපහණෙහි පිට රවුමේ දක්නට ලැබෙන පළාපෙති කැටයම ගිනිදැල් ලෙස හඳුන්වාදෙන ඔහු ඒ මඟින් සත්ත්වයා රාගාදි කෙලෙස් ගින්නෙන් දැවෙන බවත් සතුන් හතර දෙනාගෙන් ජාති, ජරා, ව්‍යාධි, මරණ යන සතර බියත් ලියවැලෙන් තෘෂ්ණාවත් හංසාවලිය මඟින් පිවිතුරු බවත් නෙළුම් මලෙන ' නිවනත් සංකේතවත් කෙරෙති යි පවසන බව
- ඩී.ටී. දේවේන්ද්‍ර මහතාට අනුව සඳකඩ පහණ ගොඩනැගිලි දොරටු සැරසීමට යොදාගත් උපායක් හා පාදෙෝනිත් ලෙස දැක්විය හැකි බව
- විනී විතාරණ මහතාට අනුව සඳකඩ පහණ චන්ද්‍ර සූර්ය දෙදෙනා පිළිබඳ විශ්වාසයට හා සශ්‍රීකත්වයට සම්බන්ධ කරමින් ඉදිරිපත් කර ඇති බව
- විලියම් ඊ වෝඩ් මහතාගේ අදහසට අනුව සඳකඩ පහණ ආශ්‍රමයක හො 'විහාර මන්දිරයක හෝ ප්‍රාසාදයක හෝ පළමු පියගැටය සමඟ ම යාවී ඇති හෙයින් එහි මැද ඇති විකසිත නෙළුම්පත් රටාව ශුද්ධ ස්ථානයකට ඇතුළු වීමේ දී බැතිමතුන්ගේ ආත්ම පූජාවෙන් කොටසක් සංකේතවත් කරන බව
- සඳකඩපහණ ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය ලොවට පෙන්නුම් කරන මාහැඟි නිර්මාණයක් බව

(ලකුණු 10යි)

(ii) පහත සඳහන් මාතෘකා දෙකකට ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න. (ලකුණු 10යි)

(1) පංච බලි

1. ඤාතීන්ට සැලකීම - ඤාති බලි
2. ආගන්තුකයන්ට සැලකීම - අතිථි බලි
3. මළවුන් වෙනුවෙන් චාරිත්‍ර ඉටු කිරීම - පුබ්බපේත බලි
4. රාජ්‍යයට ගෙවිය යුතු බදු ආදිය ගෙවීම - රාජ බලි
5. ආගම දහම වෙනුවෙන් යුතුකම් ඉටු කිරීම - දේවතා බලි

යන මෙම කරුණු පහ පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් සපයා තිබීම ප්‍රමාණවත්

(2) වලභි විශ්වවිද්‍යාලයය

- ක්‍රි. ව. 475 - 775 අතර විසූ මෛත්‍රික රජවරුන් ඉන්දියාවේ බටහිර ප්‍රාන්තයේ අගනුවර වූ වලභියෙහි ඉදි කළ මහා විහාරය පසුකාලයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රචලිත වී අවසානයේ ශ්‍රාවකයාන බුදුසමයේ කේන්ද්‍රස්ථානය ලෙස වලභි විශ්වවිද්‍යාලය වශයෙන් ගෞරවාදරයට පාත්‍ර වූ බව.
- හියුං සියැං තෙරුන්ගේ වාර්තා අනුව මෙම විශ්වවිද්‍යාලයයේ සංඝාරාම 100ක් (සීයක්) තිබූ අතර භික්ෂූන් වහන්සේලා 6000නමක් වැඩ වාසය කළ බව.

- සම්මිතිය බෞද්ධ නිකායයේ ඉගැන්වීම පුළුල් වශයෙන් ඉගැන්වූ වලභි විශ්වවිද්‍යාලයයට දෙස් විදෙස් ශිෂ්‍යයන් බොහෝ පිරිසක් පැමිණ අධ්‍යාපනය ලැබූ යි ඉට්සිංගේ වාර්තාවේ සඳහන් වන බව.
- අතිවිශාල පුස්තකාලයයක් තිබූ මෙම විශ්වවිද්‍යාලයයට පුස්තකාලයයීය අරමුදලක් ද තිබූ බව ගුහසේන රජතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපියක සඳහන් වන බව.
- පුළුල් විෂයමාලාවක් ක්‍රියාත්මක වූ මෙහි සම්මිතිය නිකායික ඉගැන්වීම්වලට ප්‍රධාන තැනක් හිමි වූ අතර පොදු වශයෙන් බුද්ධ ධර්මය තුලනාත්මක ව ඉගැන්වූ බව.
- චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ආදි කොට ඇති හින්දු දර්ශන ඉගැන්වීම ද හින්දු ධර්මශාස්ත්‍ර, දේශපාලන විද්‍යාව, වාණිජ විද්‍යාව සහ කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, චිකිසා විද්‍යාව ආදි ලෞකික විෂයයන් ද ඉගැන්වූ බව.
- වලභි විශ්වවිද්‍යාලයයේ උපාධිධාරීන් ඉගෙනුම් කටයුතුවලින් පසු ව ස්වකීය නිපුණත්වය, රාජ්‍ය සභා ඉදිරියේ දී ප්‍රදර්ශනය කළ වග ඉට්සිං වාර්තාවේ සඳහන් වන බව.
- වාද විවාද හා උත්සව අවස්ථාවන්හි දී මොවුන් සිය කුශලතා ප්‍රදර්ශනය කොට වලභි විශ්ව විද්‍යාලයයට කීර්තිය ගෙන දුන් බව.
- නාලන්දා විශ්වවිද්‍යාලයයෙන් පෝෂණය වූ එහි ආදි ගුරුවරුන් වන සුප්‍රකට ගුණමතී හා ස්ථිරමතී යන පඩිවරුන් දෙදෙනා වලභි විශ්විද්‍යාලය ගොඩනැගූ නිසා නාලන්දා පරිපාලන රටාවට සමීප වූ පරිපාලන රටාවක් මෙහි තිබූ බව.
- අධ්‍යාපනය, පරිපාලනය, පරීක්ෂණ, පුස්තකාල ආදි සියලු කටයුතු නාලන්දාවට අනුරූප වන පරිදි මෙහි ක්‍රියාත්මක වූ බව.
- වලභි විශ්වවිද්‍යාලයය ප්‍රධාන හීනයාන අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස කටයුතු කළ බව ක්‍රි.ව. 475 සිට 1200 දක්වා අඛණ්ඩ ව කීර්තිමත් හීනයාන විද්‍යස්ථානයක් ලෙස පැවති වලභි විශ්වවිද්‍යාලයය 13 සියවසේ සිදුවූ මුස්ලිම් ආක්‍රමණ නිසා විනාශ වූ බව.

(3) ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාව

- කණිෂ්ක රාජ්‍ය චකවනුවේ ම ගන්ධාර හා මථුරා යන ප්‍රදේශවල ද බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම ආරම්භ වූ බවට සාධක ඇති බව.
- මෙම සම්ප්‍රදාය දෙකෙන් පළමු ව ප්‍රතිමා නිර්මාණය වූයේ කුමන ප්‍රදේශයේ ද යන්න පිළිබඳ ව ද මතවාද පවතින බව.
- ගන්ධාර ප්‍රදේශයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය පළමු ව සිදු වූ බව වින්සන්ට් ස්මිත්, පර්සි බ්‍රවුන්, ෆුෂේ වැනි විද්වතුන් ප්‍රකාශ කරන බව.
- ගන්ධාරයේ ඇති වූ බුදු පිළිමය ග්‍රීක-රෝම කලාවේ ආභාසය ඇති ව ඇපලෝ දේව රූප ගුරු තන්හි තබාගෙන නිර්මාණය කර ඇතැයි සැලකෙන බව.
- ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාවේ සුවිශේෂී ලක්ෂණ ගණනාවක් දැකිය හැකි බව.
  - ➢ මහා කාරුණික ලීලාව දක්වයි.
  - ➢ ආභංග හෙවත් මඳක් නැමුණු කෝමල සිරුර
  - ➢ අත් සංවර ව සිරුරට ළං ව ඇත.
  - ➢ නෙත් අඩවන් ය, තොල් සිහින් ය, පරිමාතුකුල කම්මුල
  - ➢ හිසකේ ස්වාභාවික ය.
  - ➢ සිවුර ග්‍රීක ටෝගාවකට සම ය, රැළි ස්වාභාවික ය.
  - ➢ පද්මාසනය, කුඩා නෙළුම් මලක් මත දුෂ්කර ව වැඩ සිටින විලාසයකි.

(4) වාහල්කඩ

- පැරණි ඉන්දීය දාගැබ් වටා සිවුදෙසින් ඉදි වූ තොරණ සතර වෙනුවට ලංකාවේ දාගැබ්වල ගර්භයට සම්බන්ධ ව සතර දිසාවට මුහුණ ලා තනා ඇති කලාත්මක නිර්මාණය වාහල්කඩ නමින් හැඳින්වෙන බව.
- වර්තමානයේ වාහල්කඩ නමින් හැඳින්වෙන නිර්මාණ විශේෂය ශිලා ලේඛනවල සඳහන් ව ඇත්තේ ආයක හා ආදිමුඛ යනුවෙන් බව.
- පැරණි සිංහල කලාකරුවාගේ නිර්මාණ කෞශල්‍යය පිළිබිඹු කරන පැරණි කැටයම් රැසක් වාහල්කඩවල දක්නට ලැබෙන බව.
- මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි වාහල්කඩ කැටයම් උසස් කලාත්මක අගයකින් යුක්ත බව.
- එහි උතුරු වාහල්කඩ සම්බන්ධ උතුරු දිසාවට අයත් ගල්කුලුනු දෙකෙහි හිස මත සිංහ රූපත්, දකුණු වාහල්කඩ කුලුනු හිසමත ගව රූපත්, නැගෙනහිර කුලුනු හිස මත ඇත් රූපත්, බටහිර කුලුනු හිස මත අශ්ව රූපත් දක්නට ලැබෙන බව.
- ගල් කණුවල මුහුණත වර්ණ ගන්වන ලද විවිධ මල්කම් ද කළයකින් ඉහළට නගින කොළ සහිත දඬු ද දේව, මිනිස්, තිරිසන් හා පක්ෂි රූප ද දක්නට ලැබෙන බව.
- මෙහි පවත්නා කල්ප වෘක්ෂ කැටයම අතිශයින් ම සිත්ගන්නා සුළු බව.
- රුවන්මැලි සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය යන ස්තූපවල කැටයම්වලින් යුතු වාහල්කඩ පැවැති බව.
- වාහල්කඩ සෑම ස්තූපයක ම අනිවාර්ය අංගයක් නොවූ බව. (ලකුණු 05 x 2 = 10 යි)